2022 මැයි • 242 කලාපය

# රණවිරුවා






## අභිමානවත් දිනයක ඓතිහාසික මොහොතක්

හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් එම තනතුරෙන් නිල වශයෙන් සමුගැනීමෙන් අනතුරුව නව යුද්ධ හමුදාධිපති ලෙස පත්වූ මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත හමුදා සම්ප්‍රදායානුකූලව සංකේතාත්මකව යෂ්ටිය පිරිනැමූ ඓතිහාසික අවස්ථාව.

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.



# ඓතිහාසික දිනයේ ගෞරවනීය ආවර්ජනය

රටේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව සහ ස්වාධීනත්වය උදෙසා සිය වටිනා ජීවිත පරිත්‍යාග කළ ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ විරෝදාර රණවිරුවන්ගේ සදාතනික මතකයන් සහ වීරත්වය ඇගයීම සඳහා වන ජාතික රණවිරු සැමරුම් උත්සවය ඉකුත් මැයි 19 වන දින පෙරවරුවේ බත්තරමුල්ල ජාතික රණවිරු ස්මාරකය අභියසදී පැවැත්විණි.



මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් සහභාගී වූ අතර, ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජෙනරාල් ජගත් අල්විස් (විශ්‍රාමික), ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, නාවික හමුදාධිපති, ගුවන් හමුදාධිපති, පොලිස්පති, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් සහ රණවිරු සේවා අධිකාරියේ සභාපති ඇතුළු නිලධාරීන් රැසක්ද සහභාගී වූහ.

2009 මැයි මාසයට පෙර එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සමඟ පැවති කුරිරු යුද්ධයේදී මාතෘ භූමියේ ඒකීයභාවය සහ ස්වෛරීභාවය ආරක්‍ෂා කිරීම උදෙසා සිය ජීවිත පූජාකළ යුද්ධ හමුදාවේ (23,962), නාවික හමුදාවේ (1160), ගුවන් හමුදාවේ (443), පොලිසියේ (2598) සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ (456) විරෝදාර රණවිරුවන් මෙම රණවිරු සැමරුම් වැඩසටහනේදී සිහිපත් කෙරිණ.







# දෙස රකින මෙහෙයට නව වරම් ලැබදෙමින්



2022 ජූනි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී වශයෙන් පත් වූ ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසින් ඉකුත් මැයි 31 වන දින පෙරවරුවේ පත්වීම් ලිපිය භාරදුන් අවස්ථාව.



2022 ජූනි 01 වන දින සිට නව යුද්ධ හමුදාපති ලෙස පත්වූ මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් මැයි 31 වන දින පෙරවරුවේ ජනාධිපති මන්දිරයේදී සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ සුරතින් එම ධුරයේ පත්වීම් ලිපිය භාරගත් අවස්ථාව.







# ගෞරවනීය මෙහෙවරට අභිමානවත් හරසර

ධුරයෙන් නික්ම ගිය යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත හමුදා සම්ප්‍රදායානුකූල ගෞරව බුහුමන් පුදකිරීම ඉකුත් මැයි 31 වන දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී සිදුකෙරිණ. මෙම අභිමානවත් අවස්ථාවට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් එක්ව සිටියහ.

යුද්ධ හමුදාවේ අභිවෘද්ධිය උදෙසා අනුපමේය මෙහෙවරක් ඉටුකළ හිටපු යුද්ධ හමුදාධිපතිතුමන් සිය ධුරයෙන් නික්ම යනු ලබන්නේ යුද්ධ හමුදාව තුළ නොමැකෙන මතක සටහන් රැසක් ඉතිරි කොට තබමිණි. වසර දෙකකුත් මාස නවයක කාලයක් යුද්ධ හමුදාධිපති ධුරය හෙබවූ එතුමන් එහිදී හටපිරිස් අමතමින් සිය ධුර කාලය තුළ තමන් සමඟ සහයෝගයෙන් රාජකාරි කටයුතු සිදුකළ සියලු නිලයන් වෙත සිය ස්තුතිය පුදකළේය. එසේම, ජාතියේ ආරක්ෂකයින් ලෙස යුද්ධ හමුදාවේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සඳහා සිදුකරනු ලබන කැපකිරීම්ද එතුමන් විසින් නොමඳ ඇගයීමට ලක්කරන ලදී.











නික්ම ගිය යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්පිල් සිය සමුගැනීමේ අවස්ථාවේදී ඊට එක්වූ හටපිරිස් ඇමතීමටද අමතක නොකළේය. අනතුරුව එතුමන් යුද්ධ හමුදා මූලස්ථානයේ මාණ්ඩලික නිලධාරීන් හා එක්ව සමූහ ඡායාරූපයකටද පෙනී සිටියහ.



යුද්ධ හමුදාධිපතිතුමන් යුද්ධ හමුදාව සහ මව්බිම වෙනුවෙන් සිදුකළ උදාරතර මෙහෙවර සිහිපත් කරමින් යුද්ධ හමුදාධිපති කාර්යාල පරිශ්‍රයේදී එතුමන්ගේ ඡායාරූපයක් නිරාවරණය කිරීමද සිය සුරතින් සිදුකරන ලදී.



# බුහුමන් මැද නව නිලයෙන් පිදුම් ලැබූ වගයි

සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙතින් නව යුද්ධ හමුදාධිපති ලෙස පත්වීම් ලද මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ 2022 ජූනි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි ලුතිනන් ජෙනරාල් නිලයට උසස් කරන ලදී.

විකුම් පිරි උතුම් විරු පරපුරට මග පෙන්වමින් රට සුරැක පෙරට යන අභිමානවත් ගමනට දිරිය, ශක්තිය, නිදුක් සුව නොඅඩුව ලැබේවායි එතුමන් වෙත "රණවිරුවා" ද මෙසේ උණුසුම් සුබ පැතුම් එක්කරයි.



# “අසදිසි ශාක්‍යමුණි මහාසෑයේ” කොත් වහන්සේ නිරාවරණය කෙරේ

පූජ්‍ය වතුරකුඹුරේ ධම්මරතන නාහිමිපාණන්ගේ ආරාධනයකට අනුව ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඇතුළු තවත් පරිත්‍යාගශීලී බැතිමතුන් කිහිපදෙනකුගේ සුරතින් සාම්ප්‍රදායික බෙර වාදන සහ මහා සංඝරත්නයේ සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ ඓතිහාසික කුරගල "අසදිසි ශාක්‍යමුණි මහාසෑයේ" කොත් වහන්සේ නිරාවරණය කිරීම ඉකුත් මැයි 15 වන දින සිදුකරනු ලැබූහ.

කොත් වහන්සේ නිරාවණය කළ සුබ මොහොතේදී විචිත්‍රවත් බැලුන් රසක්ද ගුවනට එක්විය. මෙම අවස්ථාවේදී විහාරාධිපති හිමියන් විසින් අනුශාසනාවක් සිදුකරමින් මීට වසර කිහිපයකට පෙර අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමන් විසින් ආරම්භ කරනු ලැබූ මෙම ව්‍යාපෘතිය යථාර්ථයක් බවට පත්කිරීම සඳහා යුද්ධ හමුදාධිපතිතුමා ප්‍රමුඛ යුද්ධ හමුදා සාමාජිකයින්, සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ විශාල බැතිමතුන් පිරිසක් විසින් ලබාදුන් අනුපමේය සහයෝගය සහ අනුග්‍රාහකත්වය මෙන්ම එම කාර්‍යය්‍ය වසරක් වැනි කෙටි කාලයක් තුළ අවසන් කිරීම පිළිබඳ සිහිපත් කරන ලදී. තවද, වසර 50 කට අධික කාලයක් අබලන්ව පැවති මෙම විහාරස්ථානය බැතිමතුන් වෙනුවෙන් නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා භටපිරිස් විසින් සිදුකරනු ලැබූ කැපවීම වෙනුවෙන් ද උන්වහන්සේ විසින් එහිදී සිය ස්තුතිය පුදකරන ලදී.







පුරාවිද්‍යාත්මක වටිනාමකකින් යුත් ඓතිහාසික විහාරස්ථානයක් වන කල්තොට, කුරගල රජමහා විහාරස්ථානයේදී මෙවර පවත්වනු ලැබූ ජාතික වෙසක් සැමරුම් උත්සවයෙහි දෙවන අදියර ලෙස "අසදිසි ශාක්‍ය සුගන්ධ කුටියෙහි" බුදුරජාණන් වහන්සේගේ සහ රහතන් වහන්සේලාගේ සර්වඥ ධාතූන් තැන්පත් කිරීම ඉන් අනතුරුව සිදුකරනු ලැබිණි. යුද්ධ හමුදා බෞද්ධ සංගමය, නෙත් එෆ්එම් ගුවන් විදුලි නාලිකාව සහ තවත් බැතිමතුන් ගේ මූල්‍ය දායකත්වය මත ඉදිකරනු ලැබූ මෙම නව සුගන්ධ කුටිය, උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ගේ සුරතින් විවෘත කෙරිණ.

භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය වෙනුවෙන් සහ විහාරස්ථානයේ පරිපාලන කටයුතු සඳහා ඉදිකරනු ලැබූ මහල් 4 කින් සමන්විත නව සංඝාවාසය, පරිපාලන අංශය සහ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය වෙනුවෙන් ඉදිකරනු ලැබූ නව දාන ශාලාවද එහිදී විවෘත කරන ලදී.



# රණවිරු සැමරුම් දිනයේදී රණක්ෂිතයට පත් විරුවන්ගේ රණකාමීත්වය ඇගයේ

මාතෘභූමියේ ඒකීයභාවය වෙනුවෙන් දියත් කරන ලද මානුෂීය මෙහෙයුමේදී රණක්ෂිතයට පත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන වීරෝදාර රණවිරුවන්ගේ සුවදුක් බැලීම සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය ඉකුත් මැයි 18 වන දින අත්තිඩිය "මිහිඳු සෙත් මැදුර" සුවතා නිකේතනයේ සංචාරයක නිරත වූහ.

පසුගිය දිනට යෙදුණු රණවිරු අනුස්මරණ දිනය නිමිත්තෙන් සිදුකළ මෙම සංචාරයේදී, එම රණවිරුවන් ලද ඓතිහාසික ජයග්‍රහණය පිළිබඳ අදහස් හුවමාරු කරගැනීමෙන් අනතුරුව ඔවුන් වෙත ඇඳ ඇතිරිලි සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් පරිත්‍යාග කිරීමටද යුද්ධ හමුදාධිපති සහ සේවා වනිතා ඒකකයේ සභාපතිනිය කටයුතු කරනු ලැබූහ. තවද, රණක්ෂිතයට පත් එම රණවිරුවන් සමග තේ පැන් සංග්‍රහයකටද ඔවුහු එක්වූහ. සියලුම නවීන වෛද්‍ය උපකරණවලින් සමන්විත මෙම සුවතා නිකේතනයේ රණක්ෂිතයට පත් වීරෝදාර රණවිරුවන් 40 දෙනකු නේවාසිකව ප්‍රතිකාර ලබති.

"දැයේ පිනට පහළ වූ වීරෝදාර රණවිරුවන් වන ඔබව රැකබලා ගැනීමට සහ ඔබ රට වෙනුවෙන් සිදුකළ මෙහෙය අගය කිරීමට අපට කළ හැකි උපරිමය කරන්නෙමු. හමුදාවේ අපි සැමවිටම අපේ ජනතාව සහ රට ආරක්ෂා කිරීම සඳහා පෙරමුණ ගෙන සිටිමු. එය අතීතයේද එසේ වූ අතර මෑත කාලීනව මෙන්ම අනාගතයේද එය තවදුරටත් එසේ වනු ඇත". යුද්ධ හමුදාධිපති එම අවස්ථාවේදී රණක්ෂිතයට පත් රණවිරුවන් අමතා ප්‍රකාශ කර සිටියේය.

මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, යුද්ධ හමුදා මූලස්ථානයේ විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී, අඥාපති හඨකාර්ය සම්පාදන අණසක මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී, මිහිඳු සෙත් මැදුරේ සේනාවිධායක කර්නල් බීඒපී ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් පිරිසක්ද සහභාගී වූහ.







# යාපනයේ ජනතාව වෙනුවෙන් නව උද්‍යානයක්











සිවිල් වැසියන් සහ යුද්ධ හමුදාව අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) යටතේ ස්ථාපිත 51 වන සේනාංක මූලස්ථානය විසින් සිවිල් ජනතාවට ක්‍රීඩා, විනෝදාස්වාදය සහ අධ්‍යාපනික කටයුතු සඳහා භාවිතා කිරීම වෙනුවෙන් කෝපායි ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ CIMIC උද්‍යානය ඉකුත් මැයි 08 වන දින ජනසතු කෙරිණ. මෙහි සමාරම්භක උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය.

ජෙදුරුතුඩුව හාර්ට්ලි විද්‍යාලයේ උප විදුහල්පති ලෙස කටයුතු කළ දිවංගත ජේ.එස්. රාජරත්නම් මහතාගේ පවුලේ සාමාජිකයින්ගේ සහ තවත් ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වූ දානපතියන්ගෙන් ලද මූල්‍ය අනුග්‍රාහකත්වය මත ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ මඟපෙන්වීමෙන් 51 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී විසින් මෙම නව CIMIC උද්‍යානය ඉදිකිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලදී.

මෙම නවීන පහසුකම්වලින් සමන්විත උද්‍යානයේදී තරුණ පිරිසට ශාරීරික පුහුණු ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා ශක්තිවර්ධක ව්‍යායාම ඒකකයක්, විවේක ගැනීම හා විනෝදාස්වාදය ලබාගැනීමේ පහසුකම්, ගෘහස්ථ පාපන්දු ක්‍රීඩා පිටි පහසුකම්, ළමුන් සඳහා පුස්තකාලයක් සහිත අධ්‍යාපනික ආධාරක ඒකකයක්, සෞඛ්‍ය සහ වෛද්‍ය ආධාර ඒකකයක්, සංස්කෘතික ප්‍රසංග සඳහා විනෝදාත්මක ක්‍රියාකාරකම් සිදුකිරීමේ පහසුකම් සහ තරුණයින්ට දැනුම හුවමාරු කරගැනීම සඳහා පහසුකම් සැලසේ. තවද, බහුමාධ්‍ය ක්‍රීඩා උපකරණවලින් සමන්විත මෙම උද්‍යාන පරිශ්‍රයේ ඇවිදින මන්තීරු " වෙරා-කොටා" යොදා නිර්මාණය කර ඇත.

යාපනය අර්ධද්වීපයේ වෙසෙන සිවිල් ජනතාවගේ විනෝදාස්වාදය සහ විවේකය අර්ථාන්විතව ගතකිරීමට මෙම CIMIC උද්‍යානයෙන් පහසුකම් සැලසේ.

මේ අතර, පසුගිය වසරේ රිය අනතුරකින් ස්වාමිපුරුෂයා අභාවප්‍රාප්ත වීම හේතුවෙන් ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන ආර්. දයාපරන් මහත්මිය වෙත සංගිලි උතුර ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ නව නිවසක් සංකේතාත්මකව පවරාදීමද යුද්ධ හමුදාපතිගේ සුරතින් එහිදී සිදුකරනු ලැබීය. යාපනය ප්‍රදේශයේ වෙසෙන දානපති වාමදේව ත්‍යාගේන්ද්‍රන් මහතාගේ මූල්‍ය අනුග්‍රාහකත්වය මත ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) යටතේ ස්ථාපිත 51 වන සේනාංකයට අයත් 511 වන බලසේනා බලප්‍රදේශයේ පිහිටි 9 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ හටපිරිස්හි තාක්‍ෂණික දැනුම සහ ශ්‍රමදායකත්වය යොදාගනිමින් පසුගිය වසරේ ඔක්තෝම්බර් මාසයේදී මෙම ව්‍යාපෘතිය සඳහා මුල්ගල් තබන ලදී. තවද, මෙම අවස්ථාවේදී ප්‍රදේශයේ පාසල් සිසු සිසුවියන් 20 දෙනකු වෙත පාසල් පාවහන් බෙදාදීමද ප්‍රධාන ආරාධිත අමුත්තා ගේ සුරතින් සිදුකෙරිණ.

මෙම උත්සවය සඳහා ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති, 52 වන හා 55 වන සේනාංකාධිපතිවරු ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් එක්වූහ.

# නවාතැන් පහසුකම් සංකීර්ණය විවෘත කෙරේ





රත්නපුර, කුරුවිට ප්‍රදේශයේ ස්ථාපිත ගැමුණු හේවා බලකා රෙජිමේන්තු මූලස්ථානයේ කොමිෂන් නොලත් නිලධාරීන්ගේ භාවිතය සඳහා අභිනවයෙන් ඉදිකරනු ලැබූ මහල් තුනකින් සමන්විත නවාතැන් පහසුකම් සංකීර්ණය ඉකුත් මැයි 04 වන දින ඔවුනගේ පරිහරණයට පවරාදෙන ලදී.

එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් සඳහා මාලි රාජ්‍යය බලා පිටත්ව යන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ගෞරවාචාරයන් පිළිගැනීම සඳහා ගැමුණු හේවා බලකා රෙජිමේන්තුව වෙත සපැමිණි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් එම රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපතිගේ ආරාධනයකට අනුව කොමිෂන් නොලත් නිලධාරීන්ගේ දීර්ඝකාලීන අවශ්‍යතාවයක්ව පැවති මෙම නවාතැන් පහසුකම් සංකීර්ණය විවෘත කරනු ලැබීය.

ගැමුණු හේවා බලකායේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් පීඑම්එල් චන්ද්‍රසිරි ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත එම රෙජිමේන්තුවේ රෙජිමේන්තු අරමුදලේ මූල්‍ය දායකත්වය ඇතිව ගැමුණු හේවා බලකායේ සහ ඉංජිනේරු සේවා බලකායේ හටපිරිස්හි ශ්‍රමදායකත්වය මත මෙම නව ගොඩනැගිල්ල ඉදිකරන ලදී. තවද, එම රෙජිමේන්තුවේ නවතමයෙන් ඉදිකරනු ලැබූ ක්‍රිකට් ක්‍රීඩාංගණය විවෘත කිරීමේ අවස්ථාවටද එක්වූ ආරාධිත අමුත්තා ඉන් අනතුරුව ක්‍රිකට් ක්‍රීඩාංගණය සහ මෙම නව තණතීරුව සකස් කිරීම සඳහා සිය තාක්ෂණික කුසලතාව දැක්වූ බොම්බාඩියර් අජිත් කුමාර වෙත විශේෂ සමරු තිළිණයක්ද පිරිනැමීය. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවේ සේනාවිධායක, හඨකාර්ය සම්පාදන ආඥාපති ඇතුළු නිලධාරීන් සහ ආරාධිතයින් පිරිසක්ද සහභාගී වූහ.

# 4 වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම එතෙර මෙහෙයට

බටහිර අප්‍රිකානු රටක් වන මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායීභාවය ඇති කිරීමේ මෙහෙයුම් මූලස්ථානයේ (*MINUSMA*) එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් සඳහා දිවයිනෙන් පිටත් වූ යුද්ධ හමුදා සාමාජිකයින් 243 දෙනකුගෙන් සමන්විත ශ්‍රී ලංකා යුද්ධ හමුදා නව 4 වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම - මාලි (*Combat Convoy Company*) ඉකුත් මැයි 04 වන දින රත්නපුර, කුරුවිට පිහිටි ගැමුණු හේවා බලකා රෙජිමේන්තු මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාර පිරිනැමීය.

4 වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම - මාලි (*Combat Convoy Company*) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 12 ක් නියෝජනය කරන නිලධාරීන් 20 දෙනකු සහ සෙසු නිලයන් 223 දෙනකුගෙන් සමන්විත වේ. මේ වනවිට මාලි රාජ්‍යයේ සාමසාධක රාජකාරීවල නිරතව සිටින යුද්ධ හමුදා සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම නැවත දිවයිනට පැමිණීම ආරම්භ කිරීමෙන් පසුව මැයි මස තුන්වන සතියේදී නව සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමේ පළමු කණ්ඩායම මාලි රාජ්‍යය වෙත පිටත්වීමට නියමිතව ඇත.

ගැමුණු හේවා බලකායේ නිලධාරීන් සහ සෙසුනිලයින් මූලික කොටගත් මෙම ප්‍රධාන සාමසාධක හට ඛණ්ඩයට ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය, ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය, ශ්‍රී ලංකා සංඥා බලකාය, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය නියෝජනය කරන නිලධාරීන් සහ සෙසුනිලයින්ද ඇතුළත් වූහ.

මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවේ සේනාවිධායක, යුද්ධ හමුදා හමුදා හමුදා සම්පාදන ආඥාපති ඇතුළු නිලධාරීන් සහ ආරාධිතයින් පිරිසක් සහභාගී වූහ.









# උණුසුම් සුබ පැතුම් මැද ඓතිහාසික හමුවක්



මේජර් ජෙනරාල් නිලයට උසස් කරනු ලැබූ යුද්ධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ බ්‍රිගේඩියර්වරුන් අට දෙනකුට නිල ලාංඡන පැළඳවීම ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් සිය උණුසුම් සුබ පැතුම් මධ්‍යයේ ඉකුත් මැයි 20 වන දින සිදුකෙරිණ. එසේ නිල උසස්වීම් ලැබූ මේජර් ජෙනරාල්වරුන් වනුයේ මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩියූ පීඑස්සී අයිජී, මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩියූ, මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව් පොන්නම්පෙරුම ආර්එස්පී පීඑස්සී, මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී, මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, මේජර් ජෙනරාල් එච්ඩීකේ හෙයියන්තුඩුව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, මේජර් ජෙනරාල් එච්එම්යූ හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී සහ මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ඩීඑස්කේ ගුණවර්ධන ආර්එස්පී කේඑස්පී යන නිලධාරීන්ය. මෙම අවස්ථාවට තවත් වැදගත්කමක් එක්කරමින් උසස්වීම් ලැබූ මේජර් ජෙනරාල්වරුන් හට සංකේතාත්මකව අසිපත් ප්‍රදානය කිරීමද එහිදී සිදුවිය. සිය වෘත්තීය දිවියේ අභිමානවත් කඩඉමක් පසුකළ එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට "රණවිරුවාද" මෙසේ සුබ පැතුම් එක්කරයි.



13 වන රණවිරු සැමරුම් දිනයට සමගාමීව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කර්නල් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හත්දෙනකුද බ්‍රිගේඩියර් නිලයට උසස් කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ එවකට පාඨමාලා භාර නිලධාරී ලෙස කටයුතු කළ වත්මන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් ඉකුත් මැයි 19 වන දින එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත නිල ලාංඡන පළඳවන ලදී. එසේ නිල උසස්වීම් ලැබූ බ්‍රිගේඩියර්වරුන් වනුයේ බ්‍රිගේඩියර් එල්ජීජේඑන් ආරියතිලක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, බ්‍රිගේඩියර් එම්ඒඩීඑස් මුණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී අයිජී, බ්‍රිගේඩියර් කේඑම්වී කොඩිතුවක්කු, බ්‍රිගේඩියර් ටීඑම්එෆ් කිච්ලාන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, බ්‍රිගේඩියර් බීඑම්එස්කේකේ ධර්මවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, බ්‍රිගේඩියර් ඩීඑන්සී සේරසිංහ ආර්එස්පී යූඑස්පී සහ බ්‍රිගේඩියර් එම්ඩබ්ලිව්එස් මිල්ලගල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී යන නිලධාරීන්ය.

# කුරගල රාජ්‍ය වෙසක් උත්සවයේ නිමාව සනිටුහන් වේ









යුද්ධ හමුදා භටපිරිස් විසින් ප්‍රතිසංස්කරණය කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාමකකින් යුත් ඉපැරණි විහාරස්ථානයක් වන කල්තොට, කුරගල ආරණ්‍ය සේනාසනයේදී සතියක් පුරා පැවති රාජ්‍ය වෙසක් උත්සවයේ සමාප්ති උත්සවය මැයි මස 21-22 යන දෙදින තුළ සුවහසක් බෞද්ධ ජනතාවගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

අභිනව ධාතු මන්දිරයට බුද්ධ පූජාව පැවැත්වීම සහ භික්ෂූන් වහන්සේලා උදෙසා දානය පිරිනැමීමේ උතුම් අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඇතුළු පිරිසක් සහභාගී වූහ. එහිදී, චෛත්‍ය වෙත අලංකාර පෙරහැරකින් ගොස් පුද පූජා පැවැත්වීම සහ වත්පිළිවෙත් ඉටුකිරීම, ලොව්තුරා බුදු පියාණන් උදෙසා අෂ්ටපාන පූජාව සහ ගිලන්පස පූජා කිරීම මෙන්ම සංස්කෘතික අංගයන්ගෙන් සමන්විත අවසන් භක්ති ගීත සංදර්ශනය ඉකුත් මැයි 22 වන දින විචිත්‍රවත් අයුරින් පවත්වන ලදී.

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසා භික්ෂූන් වහන්සේලා 200 නමකින් සැදුම්ලත් මහ සඟරුවන වෙත චාරිත්‍රානුකූලව කුරගල විහාරස්ථානය සඟසතු කර බුද්ධ ශාසනයට පූජා කරන ලදී. පිරිත් සජ්ඣායනා මධ්‍යයේ පැවති මෙම උතුම් පින් කටයුත්ත සඳහා මහා සංඝරත්නය සමඟ එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා සහභාගී විය.

සබරගමුව පළාතේ පිහිටා ඇති කුරගල පුරාණ බෞද්ධ ආරාමය, ඓතිහාසික ලෙන් විහාර සංස්කෘතිය විදහාපාමින් වසර 2300 කට අධික ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියයි. පූජ්‍ය වතුරකුඹුරේ ධම්මරතන නාහිමිපාණන්ගේ අනුපමේය කැපවීමෙන් හා සැදැහැවත් බෞද්ධ බැතිමතුන්, යුද්ධ හමුදා සාමාජිකයින් ප්‍රමුඛ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ශ්‍රම දායකත්වය තුළින් මෙම බෞද්ධ විහාරස්ථානය වසරකට අඩු කාලයක් තුළ නව පුනර්ජීවයක් ලැබීය.

මෙවර වෙසක් දින කුරගල විහාරස්ථානය ඒකාලෝකවත් කරමින් පැවැති පහන් කූඩු තරගයේ ජයග්‍රාහකයින් වෙත තිළිණ ප්‍රදානයද යුද්ධ හමුදාධිපති විසින් සිදුකරන ලදී. එහි පළමු ස්ථානය ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවටද, දෙවන ස්ථානය ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායටද, 3 වන ස්ථානය ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායටද හිමි විය.

# ශ්‍රී ලංකා සංඥා බලකායට නව නිලධාරී නිවස්නයක්





ශ්‍රී ලංකා සංඥා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ මහල් දෙකකින් සමන්විත "*Cyllenes Cave*" නිලධාරී නිවස්නය ඉකුත් මැයි 26 වන දින ශ්‍රී ලංකා සංඥා බලකායේ නිලධාරීන්ගේ පරිහරණය සඳහා විවෘතකර භාරදෙනු ලැබිය. මෙම උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය.

ශ්‍රී ලංකා සංඥා බලකා නිලධාරීන්ගේ දිගුකාලීන අවශ්‍යතාවයක් සපුරාලමින් ඉදිකරනු ලැබූ මෙම නව නිලධාරී නිවස්නය රූපවාහිනී නැරඹුම් මැදිරියක්, අමුත්තන් පිළිගැනීමේ ඒකකයක්, බිලියඩ් ක්‍රීඩා කාමරයක් ඇතුළු විශේෂාංග රැසකින් සමන්විත වේ. යුද්ධ හමුදාධිපතිගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කෙරෙන "යුද්ධ හමුදා ඉදිරි උපායමාර්ගික සැලැස්ම 2020-2025" ට සමගාමීව ශ්‍රී ලංකා සංඥා බලකායේ කර්නල් සේනාවිධායක සහ ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් පීජේපී පීරිස් එන්ඩීයූ ගේ උපදෙස් මත එම බලකායේ නිලධාරීන් සහ සෙසුනිලයන් විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මෙහි ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රී ලංකා සංඥා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ හටපිරිස් ශ්‍රමදායකත්වය ලබාදුන්හ.

# රතු කුරුස සංවිධානයේ කලාප හා සන්නද්ධ මූලස්ථාන නියෝජිත යුද්ධ හමුදාධිපති හමුවෙයි





නුදුරේදී සිය ධුරයෙන් නික්ම යාමට නියමිත කොළඹ පිහිටි ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ කලාප හා සන්නද්ධ මූලස්ථාන නියෝජිත බ්‍රිගේඩියර් ජැක් ලිමේ (විශ්‍රාමික) (***Brigadier Jacques Lemay***) එම ධුරයේ රාජකාරී භාරගැනීම සඳහා මෙරටට පැමිණ සිටින එම මූලස්ථානයේ නව නියෝජිත සමගින් ඉකුත් මැයි 25 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවූහ.



# අඩම්පන් හිදී සිදුකරනු ලැබූ
# වීර ක්‍රියාව



**සෙ/371780 ලා/කෝප්‍රල් මහින්ද රාජපක්ෂ කේජී
පිඩබ්ලිව්වී ආර්එස්පී
ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව**

මහියංගනය ප්‍රදේශයේ හසලක වරදන්ගොල්ල ග්‍රාමයේ විසූ කලබටුවාවේ ගෙදර බෝධිදාස හා රාජපක්ෂ ගෙදර සිරියාවතී යන දෙපළට පුත්‍ර කලබටුවාවේ ගෙදර මහින්ද රාජපක්ෂ වර්ෂ 1989 ජුනි මස මෙලොව එළිය දුටුවේය. කුඩා මහින්දට කේ.ජී. උපාලි රාජපක්ෂ නමින් වැඩිමහල් සහෝදරයකු වූ අතර, කාලයාගේ ඇවෑමෙන් බාල සහෝදරයකුගේ සොයුරු පෙම විඳීමට වරම් ලැබිය. ඔහු කේ.ජී. සිසිර කුමාර නම් විය.

නිසි වයසට එළඹෙද්දී අධ්‍යාපන කටයුතු සඳහා මහියංගන දිල්හාර මහ විදුහල වෙත ඇතුළත් කරනු ලැබූ මහින්ද උඩත්තව ගමේ විසූ අත්තම්මාගේ නිවසේ නැවතී පාසල් ගිය අතර මහගෙදර සිට පාසල් යනවාට වඩා අත්තම්මාගේ නිවසේ සිට පාසල් යාම ඔහුට ප්‍රිය විය. පොතපත ඉගෙනීම විෂයේ සමර්ථයක් දැක්වූ මහින්ද ක්‍රීඩා කටයුතුවලදී හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් විෂයේද දැක්වූයේ උද්‍යෝගිමත් ක්‍රියාශීලී ස්වභාවයකි. ඒ හේතු කොටගෙන නිරායාසයෙන්ම ගුරුවරුන්ගේ හා සෙස්සන්ගේද ප්‍රසාදයට ලක්වීමට ඔහුට හැකිවිය.

මේ අතර ඔහුගේ වැඩිමහල් සහෝදරයා වූ කේ.ජී. උපාලි රාජපක්ෂ වරදන්ගොල්ලේ විමලා නන්ද නමින් හසලක මහ අස්වැද්දුම ශ්‍රී සම්බුද්ධ ජයන්ති මහ විහාරයේ සසුන්ගත විය. ඔහුගේ නික්මයාම හේතුකොටගෙන පවුලේ වැඩිමලාගේ භූමිකාව නිරායාසයෙන්ම ඔහුට රඟදැක්වීමට සිදුවූයේ දෛවෝපගත සිදුවීමක් ලෙසිනි.

කාලය කෙමින් ගතවිය. බොහොමයක් දුක් කම්කටොලු පැමිණෙන්නේ පූර්ව දැනුම්දීමකින් තොරවය. හදිසියේම සිදුවූ පියාගේ අභාවය මහින්දගේ පවුලට දරාගත නොහැකි පාඩුවක් හා වේදනාවක් ගෙනදුන් අතර වැඩිමලාගේ භූමිකාව ගෘහ මූලිකයාගේ භූමිකාව ලෙසට පරිවර්තනය විය.

ඉක්මනින්ම හිස එසවූ ආර්ථික ප්‍රශ්න හමුවේ පාසල් ජීවිතයට තිත තබන්නට මහින්ද තීරණය කළේ මවගේ බලවත් අකමැත්ත මතය. පාසල් ජීවිතයට සමුදුන් මහින්ද සිය පවුලේ බර කරට ගත්තේය. කය වෙහෙසා දහඩිය වගුරුවා ශ්‍රමය කැපකළ ඔහු ගම්වැසියන් දුටුවේ පවුලේ පිනට උපන් දරුවකු ලෙසය.

මේ වකවානුවේ රට තුළ පැවති යුධමය වාතාවරණය හේතුකොටගෙන දහස් ගණන් තරුණ සෙබළුන් දේශය වෙත දිවි පුද කළෝය. සෙබළකු ලෙසින් යුද්ධ හමුදාවට බැඳී වීරයකු ලෙසින් මියයාමට තරුණ මහින්ද ගේ සිතේ ආශාවක් ඇති වූ අතර එසේ ඇති වූ සිතුවිලි බීජයට පැන් පොදක් ඉස උස්මහත් කරන්නට ගමේ ඉදිව තිබූ හසලක වීරයාගේ පිළිරුව සමත් විය.

නව යොවුන් වියේ පසුවූ මහින්ද ගම්පියසේදී විටෙක ඇස ගැටෙන ගාමිණී කුලරත්නගේ පිළිරුව දෙස බොහෝ විට නැවතී බලා හිඳ කල්පනා කළේ... තමාටත් දිනෙක රණවිරුවකු වී තම පවුලට ගමට කිත් යසස් ගෙන එන්නට හැකිවේ නම් කොපමණ හොඳද යනුවෙනි. "ඔව් මම හමුදාවට යනව 18 පිරුනු ගමන්" ඔහු තීරණය කළේය. නමුත් ඒ වග අම්මාට හා අත්තම්මාට නොකියන්නට ඔහු ප්‍රවේශම් විය. යම් හෙයකින් තමා ඒ වග ඇඟවුවහොත් ඔවුන් එයට හරස් කපන බැව් ඔහු දැන සිටියේය. කෙසේ නමුත් වයස 18 සම්පූර්ණ වෙන්ම මවගේ ආශිර්වාදය ගමනට ලබාගැනීමට ඔහු දක්ෂ වූ අතර, සිය අභිලාෂය මුදුන්පත් කරගනිමින් වර්ෂ 2007 නොවැම්බර් මස 04 වන දින

ආධුනික සෙබළකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්වීමට වරම් ලද්දේය.

තිසාවැව ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා පුහුණු පාසල වෙතින් සිය මූලික හමුදා පුහුණුව ලැබූ මහින්ද සාර්ථකව පාඨමාලාව හදාරා විසිර ගොස් 12 වන බළඅණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත එකතු විය. එයද ඔහු ලද ජයග්‍රහණයක් වූයේ හසලක වීරයා නොහොත් ගාමිණී කුලරත්නගේ රෙජිමේන්තුවටම පුහුණුවෙන් පසු එක්වීමට ඔහු සපත කර සිටි බැවිනි.

මේ කාලය වනවිට 12 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව කිලිනොච්චිය විශ්වමඩු ප්‍රදේශයේ සාර්ථක ලෙස සතුරාට මුහුණදෙමින් යුධ ජයග්‍රහණ රැසක් අත්පත් කරගනමින් සිටි අතර මාතෘභූමිය මෙහෙයුමේ විවිධ ජයග්‍රහණ ලබාගත් ඔවුන් 57 වන සේනාංකයට අනුයුක්තව 572 බලසේනාව යටතේ මාතෘභූමිය මෙහෙයුමට දායක වූහ.

සාම්ප්‍රදායික යුධ ක්‍රමයෙන් මිදී කුඩා කණ්ඩායම් කෙරෙහි විශ්වාසය තැබීමට මේ දිනවල ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පෙළඹුනේ සංග්‍රාම භූමියේදී කුඩා කණ්ඩායම් ක්‍රියාන්විත ලැබූ සාර්ථකත්වය ඉතාමත් ඉහළ තත්වයක තිබූ නිසාය. ආරක්ෂක වළල්ලේ යුධ වැදී සිටි සෑම ඒකකයක්ම තම ඉලක්කයන් සපුරාගැනීමට කුඩා කණ්ඩායම් යෙදවූ අතර, 12 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවද සිය ක්‍රියාන්විත සඳහා කුඩා කණ්ඩායම් යෙදවීය. ඒකකයේ කුඩා කණ්ඩායමක සාමාජිකත්වය ලැබූ මහින්ද ඒ වනවිට සංග්‍රාම භූමියේ පෙන්වා තිබූ අපූර්ව රණකාමීත්වය හේතු කොටගෙන කා අතරත් ප්‍රසාදයට ලක්වී සිටියේය.

2008 ඔක්තෝබර් මස 16 වන දින 12 වන සිංහ බළඇණියට තවත් එක් තීරණාත්මක දිනක් උදාකරමින් සුපුරුදු පරිදි ඉහළ මූලස්ථානයන් වෙතින් තවත් ක්‍රියාන්විත නියෝගයක් ලැබී තිබුණි. ඒ විශ්වමඩු ප්‍රදේශයේ ඇති පස් බැම්මක් හා විශාල යුධ අගලක් ඉදිරියේ ඇති සතුරු බංකර් පෙළක් අත්පත්කර ගැනීමටයි. වෙතින් වෙත පැමිණි නියෝගය මහින්ද රාජපක්ෂලාගේ කුඩා කණ්ඩායමෙන් නතර විය.

සූදානමකින් යුතුව ක්‍රියාන්විතය දියත් කළද, සිතුසේ එය ක්‍රියාවට නැංවීමට ඔවුන් හට පහසු වූයේ නැත. පරාජයේ සෙවනැලි දැක වියරු වැටී සිටි ත්‍රස්තයින් උමතු වූවන් සේ සිය මුළු ශක්තිය යොදා සටන් කළ හෙයින් කුඩා කණ්ඩායමට උපක්‍රමිකව පසු බැසීමට සිදුවිය.

මේ සිදුවීම මහින්දගේ සිතට ලැජ්ජාවක් මෙන්ම වේදනාවක් ගෙනදුන් අතර කිහිපවිටක්ම ඔහු කණ්ඩායම් නායකයාගෙන් විමසුවේ "කෝප්‍රල් පස්සට යන්නේ නැතුව අපි දෙන්නා හරි පනිමුද ඇතුළට ?" යනුවෙනි.

මහින්දගේ චෛතසිකය මැනවින් තේරුම් ගෙන සිටි කණ්ඩායම් නායකයා ඕනවට වඩා ධෛර්ය බොහෝ විට අපට අවාසිදායකව සිටින බවත් ඉදිරියට යාම නුවණට හුරු නැතත් අප ක්‍රමිකව පසු බැස්සාට වරදක් නොමැති බවත් අවස්ථාවක් ලද සැනින් නැවතත් ඉලක්කය සපුරාගැනීමට කටයුතු කළ හැකි බවත් පහදා දුන්නේය. නමුත් නවක සෙබළ සොහොයුරාගේ අප්‍රතිහත ධෛර්ය දුටු කෝප්‍රල් සතුටින් ඔද වැඩී සිටියේය. "මේ වගේ තව 10 ක් උන්නනම් බළඇණිය ගොඩ" ඔහු තනිවම තමාට පවසා ගත්තේය.

සිත් තැවුලෙන් සිටි මහින්දට සුභාරංචියේ ආලෝකය රැගෙන 2008 දෙසැම්බර් මස 22 වන දිනට හිරු උදාවිය. අතහැර ආ බංකර් පෙළ යළි අත්පත් කරගැනීමට ක්‍රියාන්විතයක් දියත් කරන්නට ඉහළින් අවසර ලැබිනි. පෙර ලෙසම එම ඛණ්ඩය සතුරු බංකර පැවති ඉසව්වට ලඟා වූයේ නිමාකර ගත නොහැකි වූ කාර්යය කෙසේ හෝ නිම කිරීමේ අරමුණෙනි. නමුත් අපේක්ෂා කළ අවස්ථාවට කලින් බංකර් පෙළ අසලදී ඔවුන්හට දරුණු ප්‍රහාරයකට මුහුණදීමට සිදුවිය.

සතුරු පක්ෂයෙන් එල්ල වූ ප්‍රබල ප්‍රහාර මධ්‍යයේ හිස බිම හොවා සිටීම හැර වෙනත් කළ හැකි යමක් නොවීය. මෙලෙස තවදුරටත් සිටියහොත් සතුරන් තමා වෙතට කඩා වැද තම කණ්ඩායම විනාශකර දමන බවත් මියයන්නට හෝ රැකෙන්නට කළ යුතු එකම දෙය සතුරා සමඟ මුහුණට මුහුණ සටන් කිරීම බවත් මොරගා පැවසූ මහින්ද නැවතත් පසුබා පලායාම කිසිසේත් කළ නොහැකි බවත් මියයාම ඊට වඩා උතුම් බවත් කල්පනා කළේය.

මේ අතර මහින්ද කිසිවකුගේ අනුදැනුමකින් හෝ උපදෙසකින් තොරව එකවර නැගී සිට ඉලක්කය බලා ආර්පීජී ප්‍රහාරයක් එල්ල කර ප්‍රධාන සතුරු බංකරය විනාශකර දැම්මේ කණ්ඩායමේ සිටිය වුන් විස්මිතව බලා සිටියදීය. ඉන් නොනැවතුනු ඔහු බංකරය තුළට පැන ඉතිරිව සිටින සතුරන් 4 දෙනකු ජීවිතක්ෂයට පත් කළ අතර නැවතත් ආර්පීජී අවියට බෝම්බ කවමින් යාබද සතුරු බංකර 2 ක්ද විනාශ කළේය.

ඉන් ඔදවැඩී 4 වන බංකරය විනාශ කිරීමටද අදිටන් කරගත් ඔහු තවත් ආර්පීජී බෝම්බ ඉතිරිව නොමැති වූ බැවින් ආර්පීජී අවිය පසෙකලා අත්බෝම්බයක් රැගෙන 4 වන බංකරය දෙසට ඇදුනේ "අන්තිම එකත් ගමු කෝප්‍රල්" යනුවෙන් කෑගසා කියමිනි. නමුත් නිමේෂයකින් ලය විනිවිද ගිය වෙඩි පහරකින් මහින්ද බිම ඇද වැටෙනු දුටු සෙස්සෝ අසුරු සැනින් මහින්ද දෙසට බඩගාන්නට වූහ.

තත්පර කිහිපයක පමාවෙන් නැවතත් අසිරුවෙන් නැගිටගත් මහින්ද අවසන් බංකරය දෙසට බඩගාන්නට වූ නමුත් කණ්ඩායමේ සගයෝ ඔහු අල්ලාගෙන පෙර අත්පත් කරගත් බංකරය දෙසට ඇදගෙන ආවෝය. මඳ සිනහවකින් මුව සරසාගෙන සිටි ඔහු කණ්ඩායමේ සෙබළ සොහොයුරන් හට "මගේ සටන ඉවරයි. මගේ පිළිරුවක් හදලා ගාමිණී ගාවින්ම තියපන්" යනුවෙන් පවසා දෙනෙත් පියා ගත්තේය.

සමස්ත යුද හමුදාවේ පොදු අරමුණ වෙනුවෙන් තම ජීවිතය පරිත්‍යාග කොට තම මිතුරු පක්ෂයේ ජීවිතද ආරක්ෂා කරගනිමින් සිදුකළා වූ උතුම් ක්‍රියාවට කෘතගුණ සලකනු වස් සෙ/371780 ලා/කෝ මහින්ද රාජපක්ෂ ඝෙත් හට යුද සෙබළකු ලබන ඉහළම සම්මානය පරම වීර විභූෂණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති සහ සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ප්‍රදානය කරනු ලැබීය.

වර්ෂ 2008 වූ දෙසැම්බර් මස 25 වන දින හෝරා 17 පැයට මෙම අභීත රණවිරුවාගේ දේහය තෝරපිටිය පොදු සුසාන භූමියේදී පූර්ණ යුද්ධ හමුදා ගෞරව සහිතව මිහිදන් කළේය. මියයන විට මහින්ද රාජපක්ෂ විවාහ වී නොසිටි අතර තම දරුවාගේ වියෝවෙන් පසුව ආදරණීය මෑණියන් සහ බාල සොහොයුරා ඇතුළු ඔහුගේ පවුලේ ඥාති හිතෛෂීන් විසින් වීර පුතණුවන්, සහෝදරයා සිහිවීම පිණිස හසලක ශ්‍රී සම්බුද්ධ ජයන්ති මහ විහාරයේ පිවිසුම් දොරටුව ඔහු නමින් ඉදිකරන ලදී.

*යුද්ධ හමුදා මූලස්ථානය මගින් ප්‍රකාශිත "උත්තමාචාරය" ග්‍රන්ථයෙන් උපුටා ගැනිමකි.*

# උතුරට වෙසක්





බුදුරජාණන් වහන්සේගේ අසිරිමත් තෙමඟුල සිහිපත් කරමින් ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මගපෙන්වීම යටතේ වෙසක් පුර පසළොස්වක පොහොය දින ආගමික වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී.



එහිදී, කන්කසන්තුරය තිස්ස රජමහා විහාරස්ථානයේ දී දවස පුරා පැවති ආගමික වැඩසටහන්වලදී යුද්ධ හමුදා සාමාජික සාමාජිකාවන් 100 කට අධික පිරිසක් පෙහෙවස් සමාදන් වූහ. මිහින්තලය කළුදිය පොකුණ තපෝවන විහාරස්ථානයේ පූජ්‍ය සද්ධාජීව හිමිපාණන් වහන්සේ විසින් එහි ධර්ම දේශනයක්ද පවත්වන ලදී.

යාපනය අර්ධද්වීපය කේන්ද්‍ර කර ගනිමින් 52 වන පාබල සේනාංකය විසින් එම සේනාංක මූලස්ථානය ඉදිරිපිට A9 මාර්ගය අසල දිවා කාලයේ බත් දන්සැලක්ද, 51 වන පාබල සේනාංකය විසින් යාපනය ශ්‍රී නාග විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් 7 වන කාන්තා බලකායේ සෙබළියන් හා නාවක්කුලි මහා විද්‍යාලයේ පාසල් සිසුවියන්ගේ සහභාගීත්වයෙන් විචිත්‍රවත් "වෙසක් බැති ගී " ප්‍රසංගයක්ද රාත්‍රී බත් දන්සැලක්ද පවත්වන ලදී. තවද, ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) විසින් තිස්ස රජමහා විහාරස්ථාන පරිශ්‍රයේ රාත්‍රී බත් දන්සැලක්ද පවත්වන ලද අතර, මෙම අවස්ථාවන් සඳහා ප්‍රදේශවාසී දමිළ ජනතාව විශාල පිරිසක් සහභාගී වූ අතර, එමගින් බැතිමතුන් 6000 කට අධික ප්‍රමාණයක් සඳහා ආහාර ලබාදෙනු ලැබූහ.

# යාපනයේ ක්‍රීඩාංගණයක් යුද්ධ හමුදාවෙන් නවීකරණයට





කන්කසන්තුරෙයි "ස්ටාර් ස්පෝට් කල්බ්" ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් විසින් කරන ලද ඉල්ලීමකට අනුව ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ අධීක්ෂණය යටතේ තෙලිප්පලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ජේ/250, තෛඩ්ඩි දකුණ ග්‍රාමසේවා වසමේ පිහිටි ක්‍රීඩාංගණය නවීකරණය කිරීම ඉකුත් මැයි 18 වන දින ආරම්භ කරන ලදී. යුද්ධ හමුදාවේ තාක්ෂණික සහය සහ එහි සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වයෙන් සිදුවන මෙම කටයුත්තට "ස්ටාර් ස්පෝට් කල්බ්" ක්‍රීඩා සමාජයේ සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වයද ලැබීම සුවිශේෂී වේ. මෙම අවස්ථාවට 200 කට අධික පිරිසක් සහභාගී වූ අතර, එහිදී ක්‍රීඩා සමාජය සඳහා ක්‍රීඩා භාණ්ඩ පරිත්‍යාගයක්ද සිදුකරන ලදී. ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කෞශල්‍යය හා ශාරීරික යෝග්‍යතාවය වර්ධනය කිරීමත්, ඒ තුළින් විනයගරුක පරපුරක් බිහිකිරීමත් මෙමගින් බලාපොරොත්තු වේ.

# මාහැඟි පරිත්‍යාගයකට එක්වෙමින්





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ගේ සංවිධානය හා සම්බන්ධීකරණයෙන් "තියාගි" පුණ්‍ය ආදිකර්තෘ හා සභාපති වන වාමදේව ත්‍යාගේන්ද්‍රන් මහතාගේ මූල්‍ය දායකත්වය මත වෙහෙරතැන්න, මරතෝඩි, කැබිතිගොල්ලෑව, හොරොව්පොතාන, සම්පත්නුවර, ගජබාපුර, ඇතාවැටුණවැව සහ සිංහපුර යන ප්‍රදේශවල ජීවත්වන දිළිඳු පවුල් 1000 ක් සඳහා මුදල් පරිත්‍යාගයක් ඉකුත් අප්‍රේල් 12 වන දින සිදුකරන ලදී. මෙම වැඩසටහනේ මූලික අරමුණ වූයේ දිළිඳු පවුල්වල ජීවන තත්වය ඉහළ නැංවීම වන අතර, ඒ සඳහා තෝරාගත් දිළිඳු පවුල් 1000 ක් සඳහා රුපියල් 2000.00 බැගින් වූ මුදල් පරිත්‍යාගයන් සිදුකරන ලදී. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, 62 වන පාබල සේනාංකාධිපති හා ඒ යටතේ ඇති පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු පිරිසක් ද සහභාගී වූහ.

# මුදල් පරිත්‍යාගයක්





21 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ගේ අධීක්ෂණය යටතේ එම බලප්‍රදේශයේ නොච්චියාගම හා තන්තිරිමලය ප්‍රදේශයන්හි ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල්වල ජීවන තත්වය නංවාලීමේ අරමුණින් පවුල් 1021 ක් සඳහා රුපියල් 2000.00 බැගින් වූ මූල්‍ය පරිත්‍යාගයන් ලබාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 11 වන දින සිදුකරන ලදී.

213 වන පාබල බලසේනාධිපති කර්නල් එල්ජීජේඑන් ආරියතිලක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් පරිදි 2 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව, 5(සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව සහ 4 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ භටපිරිස් විසින් මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබූහ. මේ සඳහා මූල්‍ය ආධාර සපයන ලද්දේ "තියාගි" පුණ්‍ය ආදිකර්තෘ හා සභාපති වන වාමදේව ත්‍යාගේන්ද්‍රන් මහතා විසිනි. මෙම මූල්‍ය ආධාර පරිත්‍යාග කිරීමේ වැඩසටහන සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී විය.

# ප්‍රජාසත්කාර වැඩසටහනක්







මඩකලපුව දිස්ත්‍රික්කයේ අසරණ පවුල් සඳහා රුපියල් 350,000.00 ක් වටිනා වියළි සලාක මලු 100 ක් බෙදාදීමේ වැඩසටහනක් 233 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්ඩබ්ලිව්කේ හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්‍ෂණය යටතේ එහි හටපිරිස් විසින් ඉකුත් අප්‍රේල් 16 වන දින එම බලසේනා මූලස්ථානයේදී පවත්වනු ලැබූහ. එහි බලසේනාධිපති ගේ ඉල්ලීම මත කුරුණෑගල මුරුගන් ව්‍යාපාරයේ හිමිකරු පරිත්‍යාගශීලී සුරේෂ් මහතා විසින් මෙම වැඩසටහන සඳහා අනුග්‍රහය දැක්වූ අතර, එම අවස්ථාවට ආරක්‍ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් පීඑම්එල් චන්ද්‍රසිරි ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඇතුළු නිලධාරීන් සහ ප්‍රතිලාභීන් රැසක් සහභාගී වූහ.

# පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක්





23 වන පාබල සේනාංකාධිපතිගේ මගපෙන්වීම මත 233 වන පාබල බලසේනාධිපතිගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ එම පාබල බලසේනාවේ හටපිරිස් විසින් විග්නේෂ්වරම් විද්‍යාලය - කදිරවේලි, තිරුමගල් විද්‍යාලය - පනිච්චන්කේනි, අරුන්තති විද්‍යාලය - කන්දලඩි, වම්මිරද්දවාන් විද්‍යාලය සහ වාකරෙයි දිස්ත්‍රික්කයේ වාකරෙයි මහා විද්‍යාලයේ 6 ශ්‍රේණියේ සිසු සිසුවියන් සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 17 වන දින සංවිධානය කරන ලදී.

233 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්ඩබ්ලිව්කේ හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්‍ෂණය යටතේ පවත්වන ලද මෙම වැඩසටහන සඳහා මූල්‍ය අනුග්‍රහය කුරුණෑගල මුරුගන් ව්‍යාපාරික හිමිකරු සුරේෂ් මහතා විසින් ලබාදෙන ලදී. මෙම අවස්ථාවට නිලධාරීන්, පාසල්වල ගුරුවරු සහ සිසුන්ගේ දෙමාපියන්ද සහභාගී වූහ.

# අඩු ආදායම්ලාභී පවුල් වෙත සහන සලසයි



වෙසක් පොහොය දිනයට සමගාමීව 1 වන බලකාය සහ ඒ යටතේ පාලනය වන සේවා ඒකකයන්හි රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ දායකත්වයෙන් ඉරණමඩු, ශාන්තිපුරම් ගම්මානයේ ජීවත්වන අසරණ අඩු ආදායම්ලාභී පවුල් 100 ක් සඳහා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් මැයි 15 වන දින පැවැත්විණ.



මෙමගින් ලබාදුන් වියළි සලාක මල්ලක් රුපියල් 2500.00 කට වඩා වටිනාකමකින් යුතු විය. මෙම අවස්ථාව සඳහා 1 වන බලකායේ බ්‍රිගේඩියර් පාලන/හකාස බ්‍රිගේඩියර් ඩීඒ අමරසේකර යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.





58 වන පාබල සේනාංකාධිපති ගේ අධීක්ෂණය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල් 40 ක් සඳහා ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමේ අරමුණින් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 24 වන දින සිදුකරන ලදී. තවද, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ කර්නල් පාලන/හකාස කර්නල් එන් මහවිතාන කේඑස්පී ගේ සම්බන්ධීකරණයෙන් මේ සඳහා සහයෝගය දැක්වූ *Industrial Safety Equipment Company (pvt) Ltd* හි අධ්‍යක්ෂිකා දීපිකා ගුණසේකර මහත්මියද එක්වූවාය.

# නව අස්වනු නෙළීමේ මංගල්‍යයක්



මුලතිව් ආරක්ෂක සේනා මූලස්ථානයේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ කැපවීම හා උනන්දුව තුළින් වගාකරන ලද අක්කර 1.5 ක පමණ වන වී ගොවිතැනේ අස්වනු නෙලීමේ උත්සවය ඉකුත් අප්‍රේල් 27 වන දින ආරක්ෂක සේනා මුලතිව් (ආඥාපති) මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් එම ආරක්ෂක සේනා මූලස්ථාන ගොවිපලෙහි දී සිදුකරන ලදී.



මෙම වගාව ආරම්භයේ සිට විවිධ ආකාරයෙන් බාධා හා කාලගුණික බලපෑම් එල්ල වුවද ඊට සාර්ථකව මුහුණ දෙමින් මෙම පුරන්ව තිබූ අක්කර 1.5 ක් වූ භූමිය සාර්ථක ලෙස අස්වැද්දීමට එහි හටපිරිස් සමත්වූහ. හරිත කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා වන ජාතික වැඩසටහනට මුලතිව් ආරක්ෂක සේනාව මෙමගින් සපයා ඇත්තේ කදිම ආදර්ශයකි.

# වෙසක් පොහෝ දිනට අරුත්බර වැඩසටහනක්





59 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබණ්ඩාර යූඑස්පී ගේ උපදෙස් පරිදි එම පාබල සේනාංකය සහ ඒ යටතේ පාලනය වන ඒකකයන්හි දායකත්වයෙන් වෙසක් බැති ගී ප්‍රසංගයක් ඉකුත් මැයි 15 වන දිනට යෙදුනු වෙසක් පුන් පොහොය දිනය නිමිත්තෙන් එම සේනාංකයේදී පවත්වන ලදී.

එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා මුලතිව් (ආඥාපති) මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ සහභාගී වූ අතර, ඊට ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ඇති පාබල සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීන් ඇතුළු සෙසුනිලයින් රැසක්ද සහභාගී වූහ.

# සංචාරයක මතක සටහන්



ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සිය රාජකාරි භාර ගැනීමෙන් පසු පළමු සංචාරය ලෙස ඉකුත් මැයි 09 වන දින 14 වන පාබල සේනාංක බල ප්‍රදේශයේ සංචාරයක නිරත විය. එහිදී, එම පාබල සේනාංකය යටතේ පාලනය වන වේයන්ගොඩ පිහිටි 141 වන පාබල බලසේනා මූලස්ථානයේ රාජකාරි කටයුතු හා පාලන අවශ්‍යතාවයන් පිළිබඳ සොයාබැලූ හෙතෙම එහි භටපිරිස් ඇමතීමටද කටයුතු කරන ලදී. එම අවස්ථාවට 14 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීජීඑස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ද සහභාගී විය.



# අවැසි මොහොතේ උපකාරයක්





ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ ස්ථාපිත 61 වන පාබල සේනාංකයට අයත් 613 වන පාබල බලසේනාවේ භටපිරිස් විසින් පසුගියදා කඹුරුපිටිය සහ ඒ අවට ප්‍රදේශවල අවශ්‍යතා සහිත පවුල් සඳහා වියළි සලාක පාර්සල් 40 ක් බෙදාදෙන ලදී. යුද්ධ හමුදාවේ ඉල්ලීමකට අනුව "මිතුදම් හෙල්පින් හැන්ඩ්" (*Mithudam Helping Hand*) සංවිධානය සහ වෛද්‍ය භාග්‍යා වීරවර්ධන මහත්මිය විසින් මෙම වැඩසටහන සඳහා සිය අනුග්‍රාහකත්වය ලබාදුන් අතර, 613 වන බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඒයූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී විසින් මෙම වැඩසටහන අධීක්ෂණය කරන ලදී. කඹුරුපිටිය ප්‍රදේශයේ පිහිටි 613 වන පාබල බලසේනා මූලස්ථානයේදී මෙම වැඩසටහන පැවැත්විණි.

# උතුම් වූ පුණ්‍ය කටයුත්තකට එක්වෙමින්





ශ්‍රී පාදස්ථාන වන්දනා සමයේ සමාප්තිය සනිටුහන් කරමින් ශ්‍රී පාදස්ථාන මලුවේ සිට සධාතුක කරඬුව, සමන් දේව ප්‍රතිමාව, දේව ආභරණ සහ පූජා භාණ්ඩ යුද්ධ හමුදා ශ්‍රම දායකත්වයෙන් ඉකුත් මැයි 17 වන දින නල්ලතන්නිය වෙත වැඩමවන ලදී.

මෙම උතුම් වූ පුණ්‍ය කටයුත්ත සඳහා 19 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ නිලධාරීන් තිදෙනකු සහ සෙබළුන් සිය දෙනකු ශ්‍රම දායකත්වය දැක්වූහ. එම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු, 112 වන පාබල බලසේනාධිපති ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# අසරණ ජනයාට සරණක් වෙමින්





කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන මේ වනවිට ඇමෙරිකා එක්සත් ජනපදයේ පදිංචි අනුක් මහතාගේ පූර්ණ අනුග්‍රාහකත්වය ඇතිව ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශය තුළ ජීවත්වන ආර්ථික අපහසුතාවලින් යුත් පවුල් වෙනුවෙන් වියළි සලාක මළු 200 ක් ලබාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 10 වන දින හපුතලේ ගෝනමටාව ගම්මානයේ දී පැවැත්විණ. ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ගේ සම්බන්ධීකරණයෙන් පැවති මෙම අවස්ථාවට එම ප්‍රදේශයේ පූජකවරු ඇතුළු ප්‍රදේශවාසීන් පිරිසක් සහභාගී වූහ.

# සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාව





ශ්‍රී ලංකා යුද්ධ හමුදා සන්නාහ සන්නද්ධ බලකායේ සෙසුනිලයින්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ පවුල්වල ජීවන තත්වය නගාසිටුවීමේ අරමුණින් තෝරාගත් පවුල් සඳහා මහන මැෂින්, ශීතකරණ, ගෘහ භාණ්ඩ, රෝදපුටු සහ මුදල් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් එම බලකායේ සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වෛද්‍ය හර්ෂණී බෝතොට මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා රොක්හවුස්හි පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව





සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දර්ශණී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ලෝක කාන්තා දිනයට සමගාමීව කාන්තා දින වැඩමුළුවක් පසුගියදා එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. එම අවස්ථාවේදී වස්කඩුව සිට්‍රස් හෝටලයේ ප්‍රවීණ සූපවේදී මනෝජ් අමරදීප්ති මහතා විසින් සූපවේදී වැඩසටහනක්ද, අධ්‍යක්ෂකවරයකු සහ ටෙලිනාට්‍ය නළුවකු වන දේශමාන්‍ය නාලක හපුගොඩ මහතා විසින් විනෝදාත්මක වැඩසටහනක්ද, ජ්‍යෙෂ්ඨ උපදේශිකා අමා දිසානායක මහත්මිය විසින් "යහපත් විවාහ ජීවිතයක් සඳහා බිරිඳකගේ කාර්යභාරය සහ ගෘහාශ්‍රිත ගැටලු අවම කරගන්නේ කෙසේද" යන මාතෘකාව යටතේ හරවත් දේශනයක් ද සිදුකරනු ලැබූහ. තවද, මෙම අවස්ථාවට සපැමිණි සිටි සියලුම සේවා වනිතා සාමාජිකාවන් වෙත සමරු තිළිණ ප්‍රදානයක්ද සිදුකරන ලදී. සිංහ රෙජිමේන්තු සාමාජිකාවන් රැසකගේ සහභාගීත්වයෙන් පැවති මෙම අවස්ථාවට ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මෙන්ම සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ මෙන්ම 572 වන පාබල බලසේනාධිපතිද සහභාගී වූහ.

# විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව



ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව රණක්ෂිතයට පත්ව දැනට වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගොස් සිටින 5 වන විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් පොලොන්නරුව දිස්ත්‍රික්කයේ දකුණු හිඟුරක්ගොඩ පදිංචි සෙ/510478 සාසෙ අඹගහදූව ආර් යන සෙනී හට නව නිවසක් ඉදිකරදීමට කටයුතු යෙදිණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ මගපෙන්වීම යටතේ පානදුර "හැඩෝ වොච්" සමාගම වෙතින් ඊට මූල්‍යමය සහ ද්‍රව්‍යමය පරිත්‍යාග සිදුකර ඇත. එලෙස ඉදිකිරීමට නියමිත නිවස සඳහා මුල්ගල තැබීමේ උත්සවය පසුගියදා සිදුකෙරුණු අතර, එම අවස්ථාවට විජයබාහු පාබල රෙජිමේන්තු මූලස්ථාන බලඇණියේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ. තවද එම නිවස ඉදිකිරීම සඳහා 3 වන විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය ශ්‍රම දායකත්වය සපයනු ලබයි.

# සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව




පොල්ගහවත්ත වරුසවිතාන වැඩිහිටි නිවාසයේ නේවාසික වැඩිහිටියන් 16 දෙනකු සඳහා දවස පුරා දානය පිළිගැන්වීමේ මාහැඟි කටයුත්තක් සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛා සභාපතිනි මනෝරි සලේ මහත්මිය ඇතුළු එහි සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වුන.

# ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාව




ඉංජිනේරු සේවා බලකායට අයත් මියගිය යුද්ධ හමුදා සාමාජිකයින් 06 දෙනකුගේ දරුවන් 08 දෙනකු වෙත පාසල් උපකරණ ලබාදීමේ වැඩසටහනක් පසුගියදා ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දීපිකා ප්‍රශාන්ති චන්ද්‍රසේන මහත්මියගේ උපදෙස් මත 9(සේවි) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ සංවිධායකත්වයෙන් පවත්වන ලදී. එහිදී, එම පවුල් අතුරින් එක් පවුලක් 9(සේවි) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව වෙත කැඳවා සංකේතාත්මකව පාසල් උපකරණ ප්‍රදානය කිරීමට කටයුතු කෙරූ අතර, අනෙක් දරුවන් හට ඔවුන්ගේ නිවෙස් වෙතම ගොස් එම පාසල් උපකරණ ලබාදීමට කටයුතු කිරීම විශේෂත්වයකි.

# වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව




වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ 11 වන වාර්ෂික මහ සභා රැස්වීම එම බලකායේ සේවා වනිතා සභාපතිනි විශේෂඥ වෛද්‍ය ඒ නිල්මිණී ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා යුද්ධ හමුදා රෝහල් ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. මෙහිදී, 2022 වර්ෂය සඳහා නව නිලධාරී මණ්ඩලයක් තෝරාපත්කර ගැනීමද සිදුකෙරිණ. තවද, එම රැස්වීම අවසානයේ ජාත්‍යන්තර කාන්තා දිනය නිමිති කොටගෙන බ්‍රිටිෂ් කොස්මටික්ස් ආයතනය මගින් වෛද්‍ය බලකායේ කාන්තා නිලධාරින් සහ සෙසුනිලයින් සඳහා රූපලාවන්‍ය වැඩමුළුවක්ද පවත්වන ලදී. මේ සඳහා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක්ද සහභාගී වූහ.

# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව





දොඹගොඩ ගල්පාත පිහිටි "මව්පිය සෙවණ" වැඩිහිටි නිවාසයෙහි වැඩිහිටියන්ගේ සහ සුබෝධා ආරාමයෙහි වැඩවාසය කරනු ලබන සිල් මෑණිවරුන්ගේ සුවදුක් සොයාබලා අවශ්‍යතා පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛා සභාපතිනි චින්තාමනී වීරතුංග මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි 14 වන දින සිදුකරන ලදී. 2022 වර්ෂයෙහි වෙසක් පොහොය නිමිති කොටගෙන සංවිධානය කෙරුණු මෙම පිංකම් මාලාවට එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ රැසක්ද සහභාගී වූහ.

# විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව





පසුගියදා යෙදුණු ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉන්ජිනේරු බලකායේ රාජකාරි නියුතු නිලධාරී/සෙසුනිලයින්ගේ ගැබිනි මව්වරුන් හට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් පෝෂණ මල්ලක් පිරිනැමීම සහ සෞඛ්‍ය මාර්ගෝපදේශන පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයන් එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉන්ජිනේරු බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මෙම අවස්ථාවට හකාස අණසක ආඥාපති හා ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉන්ජිනේරු බලකාධිපති ඇතුළු නිලධාරීන්ද එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පිරිසක්ද සහභාගී වූහ.

# පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව





මුලතිව් සිලාවත්ත ප්‍රදේශයෙහි ළඳනි ළමා නිවාසයෙහි දැරියන් වෙත ත්‍යාග පිරිනැමීමේ විශේෂ උත්සවයක් ඉකුත් මැයි 03 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව හා 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය එක්ව සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට ඉදිරි නඩත්තු පෙදෙස ආඥාපති මෙන්ම යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒඑල් ඉලංගකෝන් සහ 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ. මෙම වැඩසටහන එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉනෝකා ඉලංගකෝන් මහත්මියගේ මඟපෙන්වීම යටතේ සිදුකරන ලදී.

# ශාරීරික පුහුණු උපදේශකවරු පිරිසක් විසිර යති










පනාගොඩ යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසලේදී පැවැත්වූ නිලධාරි ශාරීරික පුහුණු උපදේශක පාඨමාලාව - අංක 13, උසස් ශාරීරික පුහුණු උපදේශක පාඨමාලා අංක - 43 සහ සහකාර ශාරීරික පුහුණු පාඨමාලා අංක - 125 සාර්ථකව අවසන් කළ යුද්ධ හමුදා සාමාජිකයින් ඉකුත් මැයි 20 වන දින විසිර ගියහ. ඊට නිලධාරීන් 9 දෙනකු හා සෙසුනිලයන් 163 දෙනකු ඇතුළත් වූහ. ඔවුන්ගෙන් 35 දෙනකු ජාතික වෘත්තීය සුදුසුකම් - 4 (*NVQ Level* - 4) සහතික පත්‍ර හිමිකරගැනීමටද සමත් වූහ.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ පාබල අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරල් ඩීජී හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් පාඨමාලාව සාර්ථකව අවසන් කර විසිරගිය ශාරීරික පුහුණු උපදේශකයන් හට සහතිකපත් බෙදාදෙන ලදී. තවද, යුද්ධ හමුදා ශාරීරික පුහුණු අභ්‍යාස විද්‍යාලයේ සේනාවිධායක කර්නල් කේඒඩීසිආර් කන්නන්ගර ආර්එස්පී, නිලධාරි සහ සෙසුනිලයන් ද මෙම උත්සවය සඳහා එක්වූහ.


# යුද්ධ හමුදා බොක්සිං ක්‍රීඩකයාට එතෙර කෙළිබිමේදී ප්‍රථම ස්ථානය

ප්‍රංශයේ, පැරිස් නුවරදී මැයි මස 12 දින සිට 15 දින දක්වා පැවති "*LES Centuries International Boxing Tournament Paris* - 2022" බොක්සිං තරගාවලිය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් සහභාගී වූ 24 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් ප්‍රසන්න පීඊආර් කිලෝග්‍රෑම් 57 බර පන්තිය නියෝජනය කර ප්‍රථම ස්ථානය හිමිකරගනිමින් මවුබිමටත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටත් කීර්තියක් අත්කර දෙන ලදී.






මෙම තරගාවලිය සඳහා ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම නියෝජනය කරමින් සහභාගී වූ එකම බොක්සිං ක්‍රීඩකයා ලාන්ස් කෝප්‍රල් ප්‍රසන්න පීඊආර් වන අතර, ඔහු යුද්ධ හමුදා බොක්සිං සංගමයේ සමාජිකයකුද වේ. නුදුරේදී පැවැත්වීමට නියමිත "පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල 2022" සඳහා තරග කිරීමට පෙර ජාත්‍යන්තර බොක්සිං තරගාවලියක් සඳහා සහභාගී වූ එකම ක්‍රීඩකයාද ඔහු වේ. "පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල 2022" හි බොක්සිං තරග ඉසව්ව සඳහා සුදුසුකම් ලැබූ ක්‍රීඩකයින් පස්දෙනාම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළින් බිහිවීම ද සුවිශේෂීත්වයකි.




# මොකක්ද මේ බුත්තල යුද විද්‍යාලය



ලුතිනන් දිලංක ගුණතිලක,
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මේවන විට සිය වෘත්තීමයභාවය නැංවීම වෙනුවෙන් සුවිශේෂි වැඩසටහන් දියත්කර ඇත. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සංකල්පයකට අනුව 2020 - 2025 උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක වන්නේද ඒ වෙනුවෙනි. බුත්තල පිහිටි නිලධාරී ප්‍රගමන සහ ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ පහසුකම් සංවර්ධනය කර එහි ඉගෙනුම් සහ ඉගැන්වීමේ ධාරිතාවන් ඉහළ නැවීම සිදුකරන්නේ මෙහි තවත් එක් පියවරක් වශයෙනි. දැනටමත් හමුදා නිලධාරීන් වෙනුවෙන් ඔවුනගේ දැනුම වර්ධනය කරගැනීම සහ වෘත්තීය නිපුණත්වය ඉහළ නැංවීම වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ස්ථාපනය කළ පුහුණු මධ්‍යස්ථානයක් ලෙස මෙය භාවිතයට ගැනේ.

මෙය අක්කර 87ක භූමි ප්‍රමාණයකින් සමන්විත වන අතර මෙම භූමිය ගම් උදාව ප්‍රදර්ශන භූමිය වශයෙන් තෝරාගැණුනු අතර ඊට සමගාමීව මෙම භූමිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පවරා දෙන ලදී. එය සබරගමු විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා අධ්‍යනාංශය වශයෙන් භාවිතයට ගැණුනි. ඉන් පසුව 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය පැවැත්වීම සඳහා මෙම භූමිය යොදාගැණුනි. ප්‍රදර්ශනයෙන් අනතුරුව 2011 අගෝස්තු 01 දින පුහුණු පාසලක් ලෙස භාවිත කිරීම සඳහා එවකට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පරිත්‍යාග කරන ලදී. මෙහි මූලික පහසුකම් සංවර්ධනය කිරීම සඳහා දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයට පවරාදෙන ලදී. ඉන්පසුව යුද්ධ හමුදා මූලස්ථානය විසින් එම භූමිය නිලධාරී පුහුණු මධ්‍යස්ථානයක් ලෙසින් පවත්වාගෙන යාමට අවශ්‍යය පහසුකම් සලසන ලදී.

තිස්වසරක යුද්ධය 2009 වසරේදී මානුෂීය මෙහෙයුමකින් අවසන්වීමත් සමග යුද්ධ හමුදා නිලධාරීන්ගේ වෘත්තීමය භාවය වර්ධනය කිරීම වෙනුවෙන් මෙම ආයතනය ස්ථාපිත කරන ලදී. එය නිලධාරී ප්‍රගමන හා ප්‍රවර්ධන මධ්‍යස්ථානය ලෙසින් හැඳින්විය. වෘත්තීමයභාවයකින් යුතු යුද්ධ හමුදා නිලධාරියකු බිහිවීමට නම් ඔහු හමුදාමය ආචාරධර්ම, සංකල්ප, යුධෝපක්‍රම, තාක්ෂණික ඥාණය හොඳින් ප්‍රගුණ කර තිබිය යුතුය. එම ගුණාංගවලින් සමන්විත නිලධාරියකු බිහිකිරීම නිලධාරී ප්‍රගමන හා ප්‍රවර්ධන මධ්‍යස්ථානය විසින් සිදුකරන ලදී.

නවීන ලෝකයේ වෙනස්වන උපායමාර්ගික පරිසරය කෙරෙහි අලුතින් බිහි කෙරෙන මෙහි පවත්වන පුහුණු පාඨමාලවලින් මූලික වශයෙන් අවධානය යොමු කෙරේ. එබැවින්, රටේ සහ එහි ජනතාවගේ ආරක්ෂක අවශ්‍යතා ඉටු කළ හැකි ඉහළ නිපුණත්වයෙන් යුතු, විශ්වාසවන්ත, මනා අභිප්‍රේරණයක් ඇති, උපායශීලී සහ තාක්ෂණික වශයෙන් ප්‍රවීණ නිලධාරීන් බිහිකිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මේ අනුව, මෙම නව පරිවර්තනයන් සමග ශ්‍රී ලංකා යුද හමුදාවට වෘත්තීයභාවය ඉහළ නංවාග ැනීමට හැකි වේ.

එපමණක් නොව, සයිබර් / ඉලෙක්ට්‍රොනික යුද්ධ, රොබෝ තාක්ෂණය සහ කෘත්‍රිම බුද්ධිය වැනි උසස් හැකියාවන්ට මුහුණදීමට අනාගතයේදී සූදානම් විය යුතුය. එමෙන්ම ත්‍රස්තවාදය, ප්‍රචණ්ඩ අන්තවාදය, ආපදා කළමනාකරණය, මත්ද්‍රව්‍ය ජාවාරම්, මිනිස් ජාවාරම් සහ ලිංගික වහල්භාවය හෝ වෙනත් ආකාරයේ තර්ජන ඇතුළත් අන්තර් ජාතික අපරාධ මැඩලීම ආදිය පිළිබඳවත් අවධානය යොමුකරමින් මෙම යුද විද්‍යාලයේ පුහුණු පාඨමාලා සැලසුම්කර ඇත.

ඒ අනුව, මෙම අධ්‍යාපනික





**සයිබර්/ඉලෙක්ට්‍රොනික යුද්ධ, රොබෝ තාක්ෂණය සහ කෘත්‍රිම බුද්ධිය වැනි උසස් හැකියාවන්ට මුහුණදීමට අනාගතයේදී සූදානම් විය යුතුය. එමෙන්ම ත්‍රස්තවාදය, ප්‍රචණ්ඩ අන්තවාදය, ආපදා කළමනාකරණය, මත්ද්‍රව්‍ය ජාවාරම්, මිනිස් ජාවාරම් සහ ලිංගික වහල්භාවය හෝ වෙනත් ආකාරයේ තර්ජන ඇතුළත් අන්තර් ජාතික අපරාධ මැඩලීම ආදිය පිළිබඳවත් අවධානය යොමුකරමින් මෙම නව හමුදා යුද විද්‍යාලයේ පුහුණු පාඨමාලා සැලසුම්කර ඇත.**

**මෙම සියලුම පාඨමාලා තුළින්, මිත්‍රශීලී විදේශ රටවල ශිෂ්‍ය නිලධාරීන් 44 ක් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන් ඇතුළුව මුළු ශිෂ්‍ය නිලධාරීන් 2148 දෙනකු වෙත පුහුණුව ලබාදී ඇත.**

මධ්‍යස්ථානය යුද හමුදා යුද විද්‍යාලය ලෙස නැවත නම් කිරීම කාලෝචිත සහ අදාළ වන අතර, මෙහි උසස් අණදෙන පාඨමාලාව 2024 දී පාඨමාලා විෂය මාලාවට හඳුන්වා දෙනු ලබන අතර, එය යුද්ධ හමුදාවේ බලසේනාධිපති මට්ටමින් අණදෙන තනතුරු සඳහා අනිවාර්ය පූර්ව අවශ්‍යතාවයක් වනු ඇත.

මෙම පුහුණු ආයතනය කනිෂ්ඨ, මධ්‍යම ශ්‍රේණියේ සහ ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේ අනාගත ඕනෑම අභියෝගයක් භාරගැනීමට සහ උපායශීලීව මුහුණදීමට අවශ්‍ය පසුබිම සැකසීමට බලාපොරොත්තු වේ.

වර්තමානයේ මෙම පුහුණු මධ්‍යස්ථානය මගින් කනිෂ්ඨ මාණ්ඩලික අණදෙන්නන්ගේ පාඨමාලාව (*JSC*), කනිෂ්ඨ අණදෙන පාඨමාලාව (*JCC*) සහ ජ්‍යේෂ්ඨ අණදෙන පාඨමාලාව (*SCC*) යන පාඨමාලා තුනක් එකවර වසරකට තුන් වතාවක් පවත්වනු ලැබේ. කනිෂ්ඨ මාණ්ඩලික පාඨමාලාව ලුතිනන්වරුන් සහ කපිතාන්වරුන් සඳහාත් කණිෂ්ඨ අණදෙන පාඨමාලාව මේජර්වරුන් සඳහාත් ජ්‍යේෂ්ඨ අණදෙන පාඨමාලාව මේජර්වරුන් සහ ලුතිනන් කර්නල්වරුන් සඳහාත් පවත්වනු ලැබේ.

මෙම ආයතනය මගින් 2016 අප්‍රේල් මාසය දක්වා කනිෂ්ඨ මාණ්ඩලික පාඨමාලා 12 ක් සහ කනිෂ්ඨ අණදෙන පාඨමාලා 11 ක් පුහුණු හා අධ්‍යාපනය ලබා දී ඇත. ඉන්පසුව, 2016 අප්‍රේල් මාසයේදී, *JSC* සහ *JCC* යන දෙකම කනිෂ්ඨ අණ සහ මාණ්ඩලික පාඨමාලාව (*JC & SC*) වෙත ඒකාබද්ධ කරන ලදී. මෙම සියලුම පාඨමාලාවලින්, මිත්‍රශීලී විදේශ රටවල ශිෂ්‍ය නිලධාරීන් 44 ක් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන් ඇතුළුව මුළු ශිෂ්‍ය නිලධාරීන් 2148 දෙනකු වෙත පුහුණුව ලබාදී ඇත.

මේජර් ජෙනරාල් යූයූකේඑල්එස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී මෙම විද්‍යාලයේ සේනාවිධායක ලෙස කටයුතු කරන අතර, බ්‍රිගේඩියර් එම්සීඑස්කේ සේනාරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී නියෝජ්‍ය සේනාවිධායක ලෙසත්, කර්නල් ජීජේඑන්ඩබ්ලිව් ප්‍රනාන්දු යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී අයිජී ප්‍රධාන උපදේශක ලෙසත් දැනට රාජකාරී කරයි.

මෙහි අධ්‍යයන ශාඛාව ජ්‍යේෂ්ඨ අණදෙන අංශය, කනිෂ්ඨ අණදෙන අංශය, කනිෂ්ඨ මාණ්ඩලික අංශය ලෙස වර්ගීකරණය කර ඇති අතර එය එක් එක් පාඨමාලාවට අදාළ සියලුම පුහුණු කරුණු කේන්ද්‍ර කරන අතර අධ්‍යයන අංශය ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශයෙන් සහ පුස්තකාලයෙන් සමන්විත වේ. ඊට අමතරව පුහුණුව ලබන නිලධාරීන්ගේ තොරතුරු තාක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අංගසම්පූර්ණ තොරතුරු තාක්ෂණ අංශයක් ද පවතී.

හමුදා යුද විද්‍යාලය මගින් වෘත්තීය නිපුණතාවය වර්ධනය කිරීම සහ හමුදා නිලධාරීන් මෙන්ම තෝරාගත් සිවිල් පරිපාලන නිලධාරීන් සමඟ සමීප සබඳතා ඇතිකිරීම වෙනුවෙන් විවිධ සම්මන්ත්‍රණ ද්වි-වාර්ෂිකව පවත්වනු ලැබේ. ඒ අතරම, මෙම ආයතනය යුද කලාව සහ විද්‍යාව, ජාතික හා ජාත්‍යන්තර ආරක්ෂක කටයුතු සහ හමුදා උපාය මාර්ග පිළිබඳ පර්යේෂණ පැවැත්වීමද සිදුකරනු ලබයි.

මෙය වෘත්තීමයභාවයෙන් අනූන යුද්ධ හමුදාවක් බිහිකිරීමේ තවත් එක් පියවරක් පමණි. මේ සියලු කටයුතු ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සිදුකරනු ලබන්නේ වෘත්තීමය හමුදාවක් තුළින් රටට ජාතියට සිදුකළ හැකි මෙහෙවර තවත් ඉහළට ගෙන ඒම පිණිසය. ඔවුන් ඒ වෙනුවෙන් කැපවී සිටින්නේ ඔවුන් සැබෑම අපේ ජාතියේ ආරක්ෂකයින් වන නිසාය.

# හරවත් වැඩමුළුවක්





ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපතිගේ උපදෙස් මත 56 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එල්ඩීඑස්එස් ලියනගේ ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ගේ මගපෙන්වීමෙන් එම බල ප්‍රදේශයේ රාජකාරී කරනු ලබන අණදෙන නිලධාරීන් 40 දෙනකු සඳහා ඉකුත් අප්‍රේල් 25 සහ 26 යන දෙදින තුළ ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) ත්‍රිමාණ ශාලාවේදී වැඩමුළුවක් පවත්වන ලදී. එහිදී, අණදෙන නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා නිලධාරී ඉදිරි ප්‍රගමනය හා කාර්ය ඵල ඇගයීම, ඒකක පුහුණුවීම්, ඒකක පරිපාලනය, ගිණුම් ප්‍රතිපත්ති, අණදෙන නිලධාරීගේ වගකීම්, ජාතික ආරක්‍ෂාව, වැටුප් හා දීමනා යන විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි දේශන සිදුකරන ලදී. තවද, මෙම වැඩමුළුවේ අරමුණු පිළිබඳ ආරම්භක දේශනය 56 වන පාබල සේනාංකාධිපති විසින් සිදුකරන ලදී. වැඩමුළුව අවසානයේ සහභාගී වූ සියලුම අණදෙන නිලධාරීවරුන් සඳහා සහතිකපත්‍ර ප්‍රදානය කිරීමද සේනාංකාධිපතිගේ සුරතින් සිදුවිය.

# පාසල් උපකරණ පරිත්‍යාගයක්





65 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑී සමරසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ උපදෙස් මත 652 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඒච්එස් වනසේකර ආර්ඩබ්ලිව්පී යූඑස්පී ගේ අධීක්‍ෂණය යටතේ 10 වන ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් පලිනගර් ග්‍රාමසේවා වසමට අයත් අඩු ආදායම්ලාභී පවුල්වල ඉගෙනුම ලබන සිසුන් සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 20 වන දින පලිනගර් පාසලේදී පවත්වන ලදී. එහිදී, පාසල් පොත් සහ උපකරණ පාර්සල් 500 ක් වෛද්‍ය සීඑස් ශිවකුමාර් සහ ආර්පීජීඩබ්ලිව් වික්‍රමසිංහ යන මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් සිසු දරුදැරියන් හට ප්‍රදානය කළ අතර, ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය බත්තරමුල්ලේ පදිංචි සුරේන් ද සිල්වා මහතා විසින් දරනු ලැබීය.

# ආබාධිත පුද්ගලයින් සඳහා දිවා ආහාර වේලක්





56 වන පාබල සේනාංකාධිපතිගේ උපදෙස් මත 562 වන පාබල බලසේනාධිපතිගේ අධීක්‍ෂණය යටතේ "වරෝද් වන්නි" පුනරුත්ථාපන සංවිධානයේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් 100 දෙනකු හට දිවා ආහාර ලබාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 12 වන දින එම පුනරුත්ථාපන මධ්‍යස්ථානයේදී සිදුකරන ලදී. මෙම අවස්ථාවට 562 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑම්එස් ප්‍රේමවංශ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී වූ අතර, කතෝලික පූජකවරුන් සහ පාසල් ගුරුවරුන් ඇතුළු පිරිසක්ද ඊට එක්වූහ.

# පරිත්‍යාගයක්





68 වන පාබල සේනාංක බලප්‍රදේශයට අයත් තේව්පුරම් ග්‍රාම නිලධාරී වසමෙහි "ඉනිය වාල්ලු ඉල්ලාම්" නමැති විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සිටින පාසලක් වෙත දිවා ආහාර වේලක් ලබාදීමේ පුජා සත්කාරක වැඩසටහනක් ඉකුත් මැයි 21 වන දින එම පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව් පොන්නම්පෙරුම ආර්එස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී. තවද, මෙම අවස්ථාවට 68 වන පාබල සේනාංකයේ රාජකාරී නියුතු නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක්ද සහභාගී වූහ.

# සංවත්සර දිනය අභිමානවත්ව සමරයි





12 වන පාබල සේනාංකයේ 11 වන සංවත්සරය ඉකුත් අප්‍රේල් 02 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු අභිමානවත් සංවත්සර වැඩසටහන්වලට එම සේනාංකයේ නිලධාරීන්, සෙසු නිලයින් සහ සිවිල් සේවක මහතුන් රැසක් සහභාගී වූහ.

එහිදී, නාගරවැව සුමේධාරාම බුදුරජ වෙහෙර පිරිවෙන් විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේ 75 නමක් වෙනුවෙන් දිවා දානය පිරිනැමීම ඇතුළු ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් සංවිධානය කෙරුණු සංවත්සර වැඩසටහන් අතර සේනාංකාධිපති වෙත කඳවුරු මුරයක් පිරිනැමීම, සියලු නිල භෝජන සංග්‍රහය, හටපිරිස් ඇමතීම විශේෂ තැනක් ගන්නා ලදී.

# ඒකකයේ බෝධීන් වහන්සේ වටා වළාකුළු බැම්මක්





15 (සේවා) ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ගේ අදහසකට අනුව එම ඒකකයෙහි රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ මූල්‍ය මෙන්ම ශ්‍රම දායකත්වයෙන් කඳවුරු භූමියෙහි ස්ථාපිත බෝධීන් වහන්සේ වටා ඉදිකරන ලද වළාකුළු බැම්ම ඉකුත් වෙසක් පුන් පොහෝ දින එම ඒකක අණදෙන නිලධාරී මේජර් ඩබ්ලිව්ආර් ප්‍රසන්න ගේ සුරතින් විවෘත කෙරිණ. එහිදී, යාපනය ශ්‍රී නාග විහාරයෙහි වැඩවසන ස්වාමීන් වහන්සේ නමකගේ සහභාගීත්වයෙන් යුතුව සිදුකළ ආගමික වතාවත්වලට එම ඒකක නිලධාරීන්, සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.



# බුදු දහම තුළින් රෝග සුවය හා මානසික සහනය

ඈත අතීතයේ පටන් ලෝකයේ විවිධ ආගම් හා දර්ශණ පැවතුණි. එමෙන්ම විවිධ ශාස්තෘවරුන්ගෙන්ද අප මිහිතලයේ කිසිදු අඩුවක් නොවීය. මෙම විවිධාකාර මාර්ග දේශනා කළ ශාස්තෘවරුන් අතර, බුදුන් වහන්සේගේ ඉගැන්වීම අන් කවරකටත් වඩා ප්‍රායෝගික හා මනෝවිද්‍යාත්මක බව අවිවාදයෙන් යුතුව පිලිගන්නා කරුණකි. බුදුන් වහන්සේගේ මූලික ඉගැන්වීම විමසා බලන විට එම ඉගැන්වීම්වල මූලික හරය මුළුමනින්ම පාහේ මනෝවිද්‍යාත්මක බව වැඩි දෙනකුගේ මතයයි. එබැවින් බොහෝ අයවලුන් බුදුදහම වඩාත් මනෝවිද්‍යාත්මක වූ ආගමක් ලෙස සලකති. බුදුන් වහන්සේ ඉසිපතනේ මිගදායේදී ප්‍රථම ධර්ම දේශනාවෙන්ම හඳුන්වාදුන් චතුරාර්ය සත්‍යයෙහි මනෝවිද්‍යාත්මක ලක්‍ෂණවලින් තොර කිසිවක් ඇතැයි කිව නොහැකිය.

ලෝකයේ සර්ව බලධාරී දෙවි කෙනකු හෝ ඔහුගේ අභිමතය පරිදි විශ්වයේ පාලනය සිදුවන බව ප්‍රතික්ෂේප කරන බුදු දහම තමාගේ විමුක්තිය තමා විසින්ම සලසාගත යුතු බවත් එයට අන් කිසිවකුට කළ හැකි දෙයක් නොවන බවත් බුදුන් වහන්සේට පවා කළ හැක්කේ මඟපෙන්වීම පමණක් බවත් දේශනා කර ඇත්තේ බුදු දහමෙහි ප්‍රායෝගික බව හා ස්ථිරසාර බව මනාකොට පහදා දෙමිනි.

මෙලොව උපන් මිනිසා බැඳීම් හා ක්ලේෂයන් හේතුකොට ගෙන තම අධ්‍යාත්මය අපිරිසිදු කරගනී. මේ හේතුවෙන් සත්වයා සසරෙහි අනේක දුක්විඳිමින් ඉපදෙමින් මැරෙමින් දුකට පත්වේ. මිනිසාට තම විමුක්ති මාර්ගය උදාකරගත හැක්කේ ඔහු විසින්ම රැස්කරගෙන තිබෙන අනේකවිධ වූ ක්ලේෂයන්ගෙන් සහමුලින්ම නිදහස් වීමෙනි. එම පරම පවිත්‍ර නිදහස උදාකරගත හැකි අන් මාර්ගයක් නොමැත. එසේනම් එය මනස මුල්කරගත් ක්‍රියාවලියකි. අප තුළ උත්සාහය තිබේනම් අපගේ මනස පවිත්‍ර කරගත හැක. එහෙත් අපට අන් කෙනකුගේ මනස පවිත්‍ර කළ නොහැකිය. ඒ වෙනුවට කළ හැක්කේ ඔහුට එය කියාදීම පමණි. යම් අයකුගේ මනස පවිත්‍රකර ගත හැක්කේ ඔහුටම පමණකි.

වර්තමානයේ මිනිසා බොහෝ විට මුහුණදෙන විවිධ රෝගී තත්වයන්ට මූලාශ්‍රය වී ඇත්තේ මානසික කරුණු

**සියලු දෙය තීරණය කරන ප්‍රධාන සාධකය මුදල් ලෙස සලකමින් වර්තමාන සංකීර්ණ සමාජය තුළ ක්‍ෂණික ප්‍රතිඵල මත පිහිටා අතිශය කාර්යබහුලව යන්ත්‍ර සූත්‍ර ලෙස ක්‍රියාකරන මිනිසාට ජීවිතයේ යථාර්ථය තේරුම් ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව ඉතා අල්පය. මෙම අවිවේකී බවම මිනිසාට මානසික අසහනය ඇතිකරන අතර, එම මානසික අසමතුලිතතාවය හේතුවෙන් විවිධාකාර මානසික තත්වයන් හා ගති ලක්‍ෂණ ඇතිවේ.**

බව විද්‍යාවෙන් ඔප්පු කර හමාරය. එසේ නම් මානසික පවිත්‍රතාවය තබාගැනීම තුළින් අප මුහුණදෙන බොහෝ රෝගී තත්වයන් සුවකර ගැනීම හෝ පාලනය කිරීම කළ හැකිය.

මූලික වශයෙන් ගත්කළ බුදු දහම යනු වෙදකමකි. විසඳුමක් වශයෙන් ඖෂධයන් නිර්දේශ කරන එකම ආගම එය වන්නේය. බෞද්ධ සම්ප්‍රදාය තුළ බුදුන් වහන්සේ හඳුන්වා ඇත්තේ කායික හා මානසික රෝග පිළිබඳ ශ්‍රේෂ්ඨතම වෛද්‍යවරයා ලෙසයි. මක් නිසාද යත් සියලු රෝගවල උපත සිදුවන සසර දුකට උන්වහන්සේ ඖෂධ නියම කරන නිසාය. (මානසික සුවය - සුරංග අමරකෝන්)

මිනිසාට වැළදෙන මානසික රෝග ගත්කළ ඒවා දෙවර්ගයක් ලෙස මනෝ චිකිත්සකයින් විසින් පෙන්වාදී ඇත. එනම් මානසික මූලයකින් හා කායික මූලයකින් පැවත එන මානසික රෝග වශයෙනි. මිනිසා බොහෝ සෙයින් කායික නිරෝගීතාවය සලසාගැනීමට වෙහෙසෙති. එසේ වුවද කායික නිරෝගීතාවයෙන් යුත් පුද්ගලයකු දැකීම දුර්ලභ බවත් මානසික නිරෝගීතාවයෙන් යුතු පුද්ගලයකු දැකීම අතිශය දුර්ලභ කරුණක් බවත් බුදුන් වහන්සේ අනුදැන වදාළේ මෙයින් වසර 2550 කටත් පෙරදීය. පෘථග්ජන මිනිසකුට කායිකව රෝගී නොවී දිනයක් සතියක් මාසයක් හෝ වසරක් වුවත් ජීවත්විය හැකිය. නමුත් මානසිකව රෝගී නොවී මොහොතක්වත් ජීවත්විය නොහැකිය.

බුදුදහම මිනිසා මුල්කොටගත් දහමකි. එහි අවසාන පරමාර්ථය වනාහි පරිපූර්ණ මිනිසකු යනු ලෞකික මෙන්ම ලෝකෝත්තර වශයෙන් පරිපූර්ණ උසස් මිනිසකු බිහිකිරීම වන්නේය. මිනිසුන් ජීවිතයේ මුහුණදෙන විවිධ බාධක ගැටලු හමුවේ එම අභියෝගයන්ට නොපැකිලිව නොසැලී මුහුණදිය හැකි පෞරුෂයකින් යුත් පුද්ගලයකු බවට පත්කිරීම බුදු දහමේ අපේක්ෂාවයි.

ඉහත සඳහන් ආකාරයට මනා පෞරුෂයකින් හෙබි පුද්ගලයකු බිහිකිරීමට බුදු දහම නිවැරදි මගපෙන්වීම සිදුකරනු ලබයි. ඕනෑම අයකුට තම පෞරුෂය මනාලෙස ගොඩනැගීම සඳහා අවැසි හොඳම උපදේශයන් ත්‍රිපිටක සාහිත්‍යයෙන් සොයාගත හැකිවේ. ඒ සඳහා යම් චරිතයක් තමා ආදර්ශයට ගන්නේනම් අනුගමනය කළ හැකි හොඳම චරිතාදර්ශය බුද්ධ චරිතය වේ.

බුදුරජාණන් වහන්සේ තම චරිතය තුළින් ලෝකයාට ප්‍රකට කළ ආදර්ශය වූයේ තමා විසින්ම තමාගේ ජීවිතය දෙස බලන ලෙසයි. තමන් විසින් අනුන් ගැන හොයනවාට වඩා තමා විසින් තමා ගැනම සෙවීමේ වැදගත්කම උන්වහන්සේ පෙන්වා දුන්නේය. අනුන් ගැන හොයන පුද්ගලයා යනු තමන් පිළිබඳව තීරණයක් ගත නොහැකි පෞරුෂත්වය හීන පුද්ගලයකි. එහෙත් නිරතුරුව තමා ගැන සිතන පුද්ගලයා තම අඩුපාඩුකම්, දුර්වලකම් හඳුනාගෙන ඒවා නිවැරදිකර ගැනීම උත්සාහ ගනී. ඒ සඳහා නිවැරදි මාර්ගයට අවතීර්ණ වන්නේය.

සියලු දෙය තීරණය කරන ප්‍රධාන සාධකය මුදල් ලෙස සලකමින් වර්තමාන සංකීර්ණ සමාජය තුළ ක්ෂණික ප්‍රතිඵල මත පිහිටා අතිශය කාර්යබහුලව යන්ත්‍ර සූත්‍ර ලෙස ක්‍රියාකරන මිනිසාට ජීවිතයේ යථාර්ථය තේරුම් ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව ඉතා අල්පය. මෙම අවිවේකී බවම මිනිසාට මානසික අසහනය ඇතිකරන අතර, එම මානසික අසමතුලිතතාවය හේතුවෙන් විවිධාකාර මානසික තත්වයන් හා ගති ලක්ෂණ ඇතිවේ. වර්තමාන මිනිසා අතිශය කාර්යබහුල ජීවිතයක් ගතකරන බැවින් තමන් විසින් කරන කියන කටයුතු පිළිබඳ සිහිණුවනින් විමසා බැලීමක් සිදුනොකරයි. මේ අයුරින් වගකීම් හා කාර්යයන් වැඩිවත්ම තව තවත් අසහනයට පත්වන ඔවුහු තමන්ගෙන් සිදුවන වැරදි වසාගැනීමට තව තවත් වැරදි කිරීමට පෙළඹේ. මෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ මිනිසා කායික මෙන්ම මානසික රෝගී තත්ත්වයන්ට ගොදුරු වීමයි.

තම නුවණින් විමසා නොබලා (අයෝනිසෝ මනසිකාර) කටයුතු කරන පුද්ගලයා මෝහනයෙන් මුලාවූවකු බව පෙන්වාදෙන බුදුදහම එවැනි අයකු අපායගාමී චර්යාවන් කෙරෙහි වැඩිපුර පෙළඹෙන පුද්ගලයකු බවද පෙන්වාදෙයි. යම් අරමුණක සිදුවීමක යථාර්ථය තේරුම් ගැනීමට නොහැකිවීම හෙවත් මෝහය සියලු පෘථග්ජන පුද්ගලයන් තුළ පොදුවේ බලපැවැත්වෙන චිත්ත තත්වයකි. අපගේ මනස රෝගීවීම සඳහා බලපාන ප්‍රධානතම හේතු සාධකයක් වන්නේද මෙයයි. එය බැහැර කළයුතු තත්වයක් බව බුදුදහම මනාකොට පෙන්වාදෙයි. ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත වන්නේ ශීලයෙහි පිහිටා සිතත්, ප්‍රඥාවත් වැඩීමය. එනම් ශීල, සමාධි, ප්‍රඥා යන ගුණයන් ජීවිතයට එකතුකර ගැනීමයි.

*කර්නල් එම්ජීපී පෙරේරා (විශ්‍රාමික)*

# පුහුණු දින වැඩසටහනට අරුතක්





යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ අභිවෘද්ධිය උදෙසා පාරිභෝගිකයාගේ යුතුකම්/අයිතිවාසිකම් සහ නීතිරීති පිළිබඳ සෙබළ සෙබළියන් දැනුවත් කිරීමේ දේශනයක් බදුල්ල පාරිභෝගික සේවා අධිකාරියේ සේවය කරනු ලබන එම්ආර් රිශ්වාන් මහතා විසින් ඉකුත් මාර්තු 23 වන දින 112 වන පාබල බලසේනා මූලස්ථාන දේශන ශාලාවේදී සිදුකරන ලදී.

# පුනරුත්ථාපන මධ්‍යස්ථාන රැඳවියන්ට දිවා ආහාර වේලක්





17(සෙව්) ගජබා රෙජිමේන්තු බලප්‍රදේශයට අයත් අංක 123, මිතියමලෙ ග්‍රාමසේවා වසමෙහි පිහිටි පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් පුනරුත්ථාපනය වනු ලබන අයවලුන් වෙත දිවා ආහාර වේලක් ලබාදීමේ වැඩසටහනක් එම ඒකකයේ අණදෙන නිලධාරී සහ සෙසු නිලයින්ගේ සහභාගීත්වයෙන් ඉකුත් අප්‍රේල් 23 වන දින සිදුකරනු ලැබූහ.

# කාබනික පොහොර පරිත්‍යාගයක්





11 වන පාබල සේනාංකය යටතේ ඇති 19 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව වෙතින් කිලෝග්‍රෑම් 40 ක බරකින් යුක්ත කාබනික පොහොර මළු 250 ක් ලක්පොහොර සමාගමේ නිලධාරීන් වෙත භාරදීම ඉකුත් අප්‍රේල් 29 වන දින සිදුකෙරිණ. එම කාබනික පොහොර කිලෝග්‍රෑම් 01 ක මිල රුපියල් 8.00 ක් වීම විශේෂත්වයකි.

තවද, කාබනික පොහොර නිෂ්පාදනයේදී සිවිල් වැසියන් දිරිමත් කිරීම සඳහා අමතර ඝන පොහොර මළු 50 ක් ඔවුන් වෙත එදින නොමිලේ ලබාදීමද සිදුකෙරිණ.

# පාසල් උපකරණ සහ වියළි සලාක පරිත්‍යාගයක්






52 වන පාබල සේනාංක බලප්‍රදේශයට අයත් මඩිහේ පඤ්ඤාසි විද්‍යාලයේ පාසල් ළමුන් 44 දෙනකු සඳහා පාසල් උපකරණ කට්ටල සහ ඔවුන්ගේ පවුල් සඳහා වියළි සලාක ඇසුරුම් මළු පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 52 වන පාබල සේනාංකාධිපති බ්‍රිගේඩියර් එච්එම්යූ හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් මස 08 වන දින සිදුකරන ලදී.

තවයද, කොළඹ 7 ශ්‍රී නාරද ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ පූජ්‍ය චන්ද්‍රකිර්ති හිමියන් විසින් 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වය සමත් සිසුවකු වෙත පාපැදියක් පරිත්‍යාග කිරීමද මෙහිදී සිදුකරන ලද අතර, මෙම සත්කාරය සඳහා ජාතික උරුමයන් සුරැකීමේ මහා සම්මේලනය විසින් අනුග්‍රහය දක්වා ඇත.

# නිරීක්ෂණ චාරිකාවක්





යුද්ධ හමුදා මූලස්ථානයේ විධායක ජෙනරාල් ලෙස රාජකාරි කරනු ලබන මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඉකුත් මැයි 10 දින නිරීක්ෂණ සංචාරයක් සඳහා විනයාරක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැමිණෙන ලදී. එහිදී, විනයාරක්ෂකාධිපති බ්‍රිගේඩියර් බීඑල්ආර් බමුණුසිංහ විසින් විනයාරක්ෂක මණ්ඩලය වෙතින් සිදුකරනු ලබන කාර්යභාරය සබැඳිව විධායක ජෙනරාල් වෙත දැනුවත් කිරීමක්ද සිදුකරන ලදී.

# සේනාංකාධිපති කඳවුරු සංචාරයක



62 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී එම සේනාංකය යටතේ ඇති 621, 622 සහ 623 වන පාබල බලසේනාවන්හි සංචාරයක නිරත විය. එහිදී, එම බලසේනා යටතේ ඇති 11 වන ගැමුණු හේවා බළඇණිය, 9 වන සහ 20 වන ගජබා රෙජිමේන්තුව, 14(සේවා) ශ්‍රී ලංකා පාබල හමුදාව හා 5(සේවා) ගජබා රෙජිමේන්තුවේද සංචාරය කරමින් භටපිරිස්වල රාජකාරි ස්වභාවය හා ඔවුන්ගේ පාලන අවශ්‍යතා පිළිබඳ සොයා බැලීය.

# හිසට සෙවණක්






හිසට සෙවණක් නිවාස ව්‍යාපෘතියේ තවත් එක් අදියරක් යටතේ යාපනය ජේ/246, මයිලඩි (උතුර) හි පදිංචි පුනරුත්ථාපනය වූ හිටපු එල්ටීටීඊ සාමාජිකයකු වන රාසවල්ලන් තබෝරූබන් මහතා වෙනුවෙන් ඉදිකරන ලද නව නිවසක් භාරදීමේ උත්සවය ඉකුත් අප්‍රේල් 11 වන දින සිදුකෙරිණ. මෙම නිවස විවෘත කිරීමේ අවස්ථාවට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ද *ZOOM* තාක්ෂණය ඔස්සේ සම්බන්ධ විය. 55 වන පාබල සේනාංකාධිපති බ්‍රිගේඩියර් එම්කේජීපී ගුණරත්න ආර්එස්පී එන්ඩියූ පීඑස්සී අයිජී ගේ සම්බන්ධීකරණයෙන් විජ් නඩරාජා මහතා විසින් මෙම නිවස සඳහා මූල්‍ය දායකත්වය ලබාදී ඇති අතර, 515 වන පාබල බලසේනාවේ අධීක්ෂණය යටතේ 10 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා භටපිරිස් විසින් ඊට ශ්‍රමදායකත්වය ලබාදුන්හ.





රණබිමේ මතක

# ඇනිකට් හන්දියේ "සමරේ"




සටහන
ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ


1990 දශකය මැද භාගය මා මඩකලපු ප්‍රදේශයේ සේවය කළ අවධියයි. ලුතිනන්වරයකු ලෙස යොවන වයසේ පසුවූ මා තුළ වෘත්තීය දිවියේ බොහෝ මතක ඉතිරි වූ සමයද එයම විය. එවක මා රාජකාරී කළ කඳවුර පුනානි දුම්රියපොල සිට මඩකලපුව දෙසට වන්නට ඇති "118" වන සැතපුම් කනුව අසල පිහිටා තිබුණි. එය තේක්ක ගස් යායකින් වටව උස්භූමියක පිහිටි හුදෙකලා කඳවුරකි. එතැන් සිට තවත් කිලෝමීටර් දෙකහමාරක් පමණ ගියතැන "ඇනිකට් හංදිය" කඳවුර පිහිටා තිබූ අතර, ඉන් ඔබ්බටද මහා මාර්ගයට යාව තැන තැන හුදෙකලා කඳවුරු රැසක්ම ස්ථාපිතව තිබිණ.

යාබද පිහිටි ඇනිකට් හන්දිය කඳවුරෙහි කඳවුරු භාර නිලධාරී වූයේ ලුතිනන් නිශාන්ත සමරරත්නය. කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි සිසුවකු වූ ඔහු පදිංචිව සිටියේ කොළඹ රාජගිරියේය. වෘත්තිය තුළ ඉතා සමීප මිතුරකු වූ ඔහුට මා මෙන්ම සමකාලීන හිතවතුන් ඇමතුවේ "සමරේ" යන ආදරණීය වදනිණි. අප දෙදෙනාම එකම දින යුද හමුදාවට බැඳී එකම පාඨමාලාවකට අයත්ව පුහුණුව ලැබ එකම ඒකකයක රාජකාරී කළ අයවලු වූහ. එසේම යාබද කඳවුරු දෙකක සිටි බැවින් එම හිතවත්කම් තවදුරටත් සවිමත් වූ අතර ක්‍රියාන්විත රාජකාරී මධ්‍යයේ වුව ඔහු හා මා නිරතුරුව මුණගැසුණි. එහිදී, පුද්ගලික ජීවිතවල බොහෝ තොරතුරු හුවමාරු කරගන්නා ලද අතර සමරේගේ පෙම්වතිය පිළිබඳ කතාබස් කරන්නටද ඒ සැම විටම ඔහු අමතක නොකළේය. ඒ වනවිට ඔහුගේ පෙම්වතියද කොළඹට ආසන්නව පදිංචිව සිටි අතර ඇය පුද්ගලික ආයතනයක රැකියාවකද නිරතව සිටියාය. යුධ හමුදාවට බැඳීමට පෙර සිටම පැවති දීර්ඝකාලීන පෙම් සබඳතාවක් එලෙස එළැදරා තිබුණි.

දිනක් ඇඳිරි වැටෙන්නට ආසන්න වේලාවක ලුතිනන් සමරේ මා සිටි කඳවුරට පැමිණියේය. ඒ දීර්ඝ නිවාඩුවක් අවසන ඔහු සිටි "ඇනිකට් හන්දිය" කඳවුරට යන අතරතුරය. වෙනදාට වඩා සිනාමුසුව සැහැල්ලුවකින් සිටි සමරේ නිවසේ සිට රැගෙන ආ අලුවා පාර්සලයක්ද එහිදී මා අත තැබීය. අනතුරුව මද වේලාවක් ඔහු හා ආගිය තොරතුරු කතාබස් කරද්දී සිය පෙම්වතිය පිළිබඳ අලුත්ම තොරතුරක් ද හෙතෙම මා හමුවේ පැවසුවේය. එනම් නුදුරේදී ඔහු ඇය හා විවාහ වන බවකි. "මචං උඹ තමයි මගේ බෙස්ට්මෑන්. දෙසැම්බර් වෙද්දී මගේ වෙඩින් එක ගන්නවා". ඔහු මගේ සුරතද අල්ලා ගනිමින් පැවසුවේ මහත්වූ උද්දාමයකිනි. මෙවර නිවාඩුවේදී

පවුලේ වැඩිහිටි පාර්ශව සමඟ ඒ පිළිබඳ සියලු තීරණවලට එළැඹි බවද, එහිදී ඔහු වැඩිදුරටත් මා හමුවේ පැවසීය. වසර හතරක ප්‍රේමය අභිසෙස් ලබන්නට නියමිත බව දැනෙද්දී සමරෙගේ මුහුණේ දිස්වූ බලාපොරොත්තු සහගත බව එදින ඔහු මාගෙන් සමුගත් ඇඳිරි වැටුණු මොහොතේ වුව ඔහුගේ ඇස්වල සටහන්ව තිබූ අයුරු දැකගත හැකි විය.

සති කිහිපයක ඇවෑමෙන් පැවැත්වීමට නියමිතව තිබූ ලුතිනන් සිට කපිතාන් නිලය දක්වා වූ නිල උසස් කිරීමේ විභාගයට ඒ වනවිට අප සූදානමින් සිටි කාලයයි. මා මෙන්ම ලුතිනන් සමරරත්නද පැවති ක්‍රියාන්විත රාජකාරී මධ්‍යයේ වුවද ලැබෙන හැම විරාමයකදීම විභාග කටයුතු වෙනුවෙන් වෙන්කරන ලද්දේ කපිතාන්වරයකු වීමේ සිහිනයද දකිමිණි. විශේෂයෙන්ම සමරේ හා මා විටින් විට මුණගැසී ඒ සැබෑදිව සාකච්ඡා කළ වාරද කොතෙකුත් තිබිණ.

එක්තරා දිනක උදෑසනම ලුතිනන් සමරේ එම කඳවුරේ ගුවන්විදුලි පණිවිඩ හුවමාරු යන්ත්‍රය ඔස්සේ මා ඇමතීය. එහිදී, ඔහු කියා සිටියේ උදෑසන රාජකාරී කටයුතු අවසන් කළ සැනින් විභාගයේ පාඩම් වැඩ සඳහා මා මුණගැසීමට පැමිණෙන බවයි.

ඒ වනවිට සෑම දිනකම උදෑසනින් ඒ ඒ කඳවුරු බලප්‍රදේශවල මාර්ග සෝදිසි කොට ඒවායේ ආරක්ෂාව තහවුරු කිරීම (*Route Clearing*) එවකට අප වෙත පැවරුණු අනිවාර්ය වගකීමක් විය. ඒ අනුව මාද හටපිරිසක් සමඟ උදෑසනින්ම මාර්ග සෝදිසි කිරීමේ ක්‍රියාන්විතයට සූදානම් වෙමින් සිටියදී එක්වරම යාබද ඈනිකට් හන්දිය කඳවුර දෙසින් ඇසුනේ අඛණ්ඩ වෙඩි වරුසාවකි. වෙනදා නොඇසෙන තරම් වූ එම වෙඩි හඬවල් කිසියම් භයානක සිදුවීමක පෙරනිමිත්තක් බැව් වටහාගැනීමට අපහසු නොවීය. එහිදී ගුවන් විදුලි පණිවුඩ හුවමාරුව ඔස්සේ දැනගන්නේ මාර්ග ආරක්ෂක රාජකාරිවල යෙදී සිටි ලුතිනන් සමරරත්න ඇතුලු පිරිසට සැඟවී සිටි ත්‍රස්තවාදීන් ප්‍රහාරයක් එල්ලකොට ඇති බවයි. සිද්ධිය සැලවීමත් සමඟ මා වහා ක්‍රියාත්මකව සෙබළ කණ්ඩායමක් ද සමඟ එම සීමාවට ළඟාවුවද ඒ වනවිට එහි සටන් නිමාවී තිබුණි. එහිදී, වැඩිදුරටත් අවට පරීක්ෂා කිරීමේදී දැකගත හැකිවූයේ ප්‍රධාන මාර්ගයෙන් තරමක් ඇතුළට වන්නට පිහිටි කැලෑබද ප්‍රදේශයේ තුවාලකරුවන් කිහිප දෙනකු තැන තැන වැටීසිටින අයුරුය. ඒ වනවිට යාබද කඳවුරු දෙකකින්ද අතිරේක හටපිරිස් එහි ළඟාවී තිබුණි. එහිදී, අප එකතුව කඩිනමින් තුවාලකරුවන් ප්‍රතිකාර සඳහා යොමුකොට ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරනු ලැබූහ.

කෙසේ වුවද ප්‍රහාරය වනවිට ලුතිනන් සමරරත්නද එහි සිට තිබුනද එතෙක් ඔහු පිළිබඳ හෝඩුවාවක් නොවීම අප සැමගේ විමතියට හේතු විය. එබැවින් ප්‍රදේශය සොයාබලා පරීක්ෂා කිරීමේ ක්‍රියාන්විතයක්ද (*Search and Clear Operation*) එහිදී අප ක්ෂණිකව ආරම්භ කරනු ලැබූහ. ඒ අනුව ප්‍රධාන මාර්ගයේ සිට වාකරය දෙසට ක්‍රියාන්විතය දියත් කොට මද දුරක් යත්ම ලද පණිවුඩය වූයේ මාර්ගය ආසන්නයේ තැනක ලුතිනන් සමරරත්න සිටින බවකි. තොරතුරු ලද සැනින් මා හට දැනුනේ සැනසුම් සහගත හැඟීමකි. ඒ අනුව ක්‍රියාන්විතය නවතා ලුතිනන් සමරේ දැකීම පිණිස මා ඒ දෙසට ගමන් කළේ නොතිත් ආශාවෙනි. නමුත් එහිදී මා දුටුවේ අනපේක්ෂිත දසුනකි. මහාමාර්ගයට යාබද වූ වලක් තුළ ලුතිනන් සමරරත්නගේ නිසල සිරුර විය. ප්‍රහාරයෙන් ඔහුගේ නලල සමීපයේ ගැඹුරු පැල්මක් තිබූ අතර දැඩි සමීප සටනක් එහි පැවති බවක්ද පෙන්නුම් කෙරිණ. කිසිවක් යළි ආපසු හැරවිය නොහැකි ලෙස එහි අවාසනාව පමණක් ඉස්මතුව තිබිණ. එහිදී සමරේ දුටු මා තුළ වූ කම්පනය විස්තර කළ නොහැකි තරම් විය. එසේම එය මා හට කිසිසේත් දරාගත නොහැකි අවස්ථාවකි. එහිදී, සෙසු හටපිරිස් ඉදිරියේ මා සංවේදී නොවීමට කෙතරම් වගබලා ගත්තද ඇසින් නොගිලිහුණු කඳුළු හදවත තුළින් ලෝරෙගලායාම මා හට පාලනය කරගත නොහැකි විය. බලාපොරොත්තු පොදි බැඳි සමීපතමයින්ගේ නිහඬ නික්මයාම එම යුධ බිම තුළ සාමාන්‍ය කරුණක් වී තිබුනේ එතරම්ම අවාසනාවන්ත ලෙසිනි.

ප්‍රහාරය සැලවීමෙන් මද වේලාවකට පසු ප්‍රදේශයභාර බලසේනාධිපති එහි පැමිණියේය. එහිදී, සිද්ධිය පිළිබඳ සොයාබැලීමෙන් අනතුරුව ඔහුගේ නියමයෙන් එහි සිටි මීළඟ ජ්‍යේෂ්ඨයා ලෙස ඒ මොහොතේම ලුතිනන් සමරරත්න සිටි කඳවුරට මා අනුයුක්ත කරනු ලැබීය. ඒ වනවිටත් මියගිය හා තුවාල ලැබූවන් පොළොන්නරුව රෝහල කරා පිටත් කර යවා තිබූ අතර ප්‍රදේශයේ ආරක්ෂාවද තහවුරු කොට තිබිණ.

එදින රාත්‍රිය ලුතිනන් සමරරත්න සිටි කඳවුරෙහි මා හට ගෙවන්නට වූවේ නිදි වර්ජිතවය. එතෙක් මා සිටි හුරුපුරුදු

**එකම දිනක යුද හමුදාවට බැඳී එකම භූමියක සටන් වැද දෑස් ඉදිරිපිටදීම අවසන් ගමන් ගිය සහෝදර සගයාගේ ජීවන තොරතුරු කියවද්දී ඔහු පිළිබඳවූ අප්‍රමාණ මතක දෑස් අභිමුව චිත්‍රනය වන්නට වූයේ නිරායාසයෙනි. කෙසේ හෝ අවසානයේ බොහෝ පීඩනයක් සිත්හි දරාගෙන මා විසින් එම කටයුත්ත මහත් ආයාසයෙන් නිමකරන ලද්දේ නෙතු අග පොදිකමින් සිටි එකදු කඳුළු බිඳුවකට හෝ ගිලිහෙන්නට ඉඩක් නොදෙමිණි. එම සටහන කියවා අවසන කිසිවකු මාගේ කනට යමක් කොඳුරන සෙයක් දැනුණි. "මචං උඹ තමයි මගේ බෙස්ට්මන්" මම තිගැස්සී අවට බැලීම්.නිසැකවම එය සමරෙගේ හඬය. ආචාර වෙඩිමුර අවසානයේ පසෙකින් ඇසෙන පාලු මුසල බියුගල් නලා හඬ අතරේ කපිතාන් සමරරත්නගේ දේහය සෙමෙන් සෙමෙන් පොළොවට පහත් වෙමින් තිබිණි.**

ස්ථානය අතහැර එලෙස අනපේක්ෂිත ලෙස අලුත් තැනකට මාරුවීමට සිදුවීමද මා සිත රිදුම් දෙන්නක් විය. මම සමරෙගේ කඳවුර තුළ වූ ඔහුගේ කාමරයට එබුනෙමි. තල් හා පොල්කොටවලින් වටකොට වකරන් තහඩු හෙවිල්ලා තිබූ එම කුඩා කාමරය තුළ යකඩ ඇඳක් හා ලී පෙට්ටි දෙකක් හැරුණු විට අන් යමක් නොවීය. එහෙත් ඒ සියල්ල අතරේ ඉහළ තැනක තැබූ කුඩා බුදු කුටියක්ද ඊට යාබද කණුවක එල්ලූ ඔහු හා පෙම්වතිය එකට හිඳ ගත් ඡායාරූප කිහිපයක්ද විය. එසේම කපිතාන් විභාගයට අදාළ පොත්පත් හා සටහන් රැසක්ද පසකය. බලාපොරොත්තු ප්‍රාර්ථනා සැලසුම් පිරි තාරුණ්‍යයේ සුසුම් පමණක් ඉතිරිවූ එම කුඩා කුටිය තුළ සමරෙගේ සුවඳ නාස්පුඩු සිසාරා යන්නට විය. අඳුරු කුටියේ කවුළුවෙන් මා පිටත බැලීය. යාබද බංකරයෙහි සෙබළකුගේ කළු පැහැති ඡායාව යාන්තමින් දිස්වේ. තිත්ත කළුවර තුළ දීප්තිමත් යමක් එහි වූයේනම් ඒ කණාමැදිරියකුගේ එළිය පමණි.

දින දෙකක ඇවෑමෙන් සමරෙගේ භූමදාන කටයුතු බොරැල්ල කනත්තේදී පූර්ණ හමුදා ගෞරව සහිතව සිදුකිරීමට නියමිත විය. ඒ වනවිට ඔහු කපිතාන් නිලයටද උසස්කොට තිබිණ. නමුත් එය ඔහුගේ සැබෑ ජීවිතයේ සැබෑ නොවූ කපිතාන් සිහිනයයි. රාජගිරියේ පිහිටි ඔහුගේ නිවසේ සිට දේහය බොරැල්ල කනත්ත දක්වා රැගෙනයාමේ අවස්ථාවේ පෙර ගමන් රථයෙහි මාද ගමන් ගත්තේය. මියගිය සෑම රණවිරුවකුගේම අවසන් කටයුතු සිදුකරන අවස්ථාවේදී දේහය මිහිදන් කරන ස්ථානයේ සිට ඔහුගේ සමස්ත යුද්ධ හමුදා චරිතය පිළිබඳ සවිස්තරාත්මක ලියවිල්ලක් කියවනු ලබයි. (යුද හමුදාව තුළ එම ලියවිල්ල *Part I* ලෙස හඳුන්වයි) නිලධාරියකු විසින් කියවන එම ලියවිල්ල කපිතාන් සමරරත්නගේ දේහය ඉදිරියේ කියවීමේ වගකීම පැවරුණේ මා හටය.

එකම දිනක යුද්ධ හමුදාවට බැඳී එකම භූමියක සටන් වැද දැස් ඉදිරිපිටදීම අවසන් ගමන් ගිය සහෝදර සගයාගේ ජීවන තොරතුරු කියවද්දී ඔහු පිළිබඳවූ අප්‍රමාණ මතක දැස් අභිමුව චිත්‍රනය වන්නට වූයේ නිරායාසයෙනි. කෙසේ හෝ අවසානයේ බොහෝ පීඩනයක් සිත්හි දරාගෙන මා විසින් එම කටයුත්ත මහත් ආයාසයෙන් නිමකරන ලද්දේ නෙතු අග පොදිකමින් සිටි එකදු කඳුළු බිඳුවකට හෝ ගිලිහෙන්නට ඉඩක් නොදෙමිණි. එම සටහන කියවා අවසන කිසිවකු මාගේ කනට යමක් කොඳුරන සෙයක් දැනුණි. "මචං උඹ තමයි මගේ බෙස්ට්මෙන්" නිසැකවම එය සමරෙගේ හඬය. මම තිගැස්සී අවට බැලීමි. ආචාර වෙඩිමුර අවසානයේ පසෙකින් ඇසෙන පාලු මූසල බියුගල් නලා හඬ අතරේ කපිතාන් සමරරත්නගේ දේහය සෙමෙන් සෙමෙන් පොළොවට පහත් වෙමින් තිබිණි. ඇතිකට්ටි හන්දියේ අවට පරිසරයේ තේක්ක සුවඳ රැඳි සිසිල් සුළං පොදක් ඒ මොහොතේ කනත්ත සිසාරා හමා යන්නට විය. සිය ගණනකගේ සෝ සුසුම් අතරේ එක් ඉකිබිඳුමක් පමණක් ඒ සුළඟට මුසුව තිබිණ. ඒ සමරෙගේ පෙම්වතියගේ හඬය.

ඉහත සිදුවීමට මේ වනවිට වසර 27ක් ගෙවී අවසන්ය. අපි අපේ ජීවිතවල බොහෝ දුර පැමිණ ඇත්තෙමු. මා දන්නා තරමට මේ වනවිට කපිතාන් සමරරත්නගේ ඥාතීන් රාජගිරියේ නොමැත. රණවිරු පෙම්වතකු නිසාම ජීවිතයෙන් බොහෝ දුක් පීඩාවන් විඳි සමරෙගේ පෙම්වතිය ඒ සියල්ල දරාගනිමින් තම ජීවිතයට මුහුණ දුන්නාය. ඇය මේ වෙද්දී කොහේදැයි මා නොදනී. ඇතැම්විට ඇය පසුකාලීනව වෙනත් විවාහයක් කරගත්තා විය හැක. කපිතාන් සමරරත්නගේ කතාව අපට පසක් කරනුයේ තිස් වසක් යුද්ධයේ එක් පැතිකඩක් පමණි. සමරෙලා වැනි අයවලුන් කොතෙකුත් මේ බිමෙහි වැළලී ඇත්ද. එම විරුවන්ගේ සිරුරු දිරාගියද ගරානොවැටුණු ඔවුන්ගේ සෙහොන්කොත් අතර තාරුණ්‍යයේ අසීමිත බලාපොරොත්තු සමුදායක් අදටද ජීවමානව ඇත. ඔවුන් වෙනුවෙන් සුසුමක් පිටකරන්නට හැකි ළතෙත් හදවතක් ඔබට වෙත්නම් එහි උණුසුම නිසැකවම සමරෙටද දැනෙනු ඇත.

# පාසල් දරු දැරියන් සඳහා පාවහන් පරිත්‍යාගයක්





54 වන සේනාංක බල ප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීම මෙන්ම, ඔවුන්ගේ මානසිකත්වය වර්ධනය කොට සිවිල් ජනතාව සහ යුද්ධ හමුදාව අතර සංහිඳියාව ඇතිකිරීමේ අරමුණින් මන්නාරම සිරිතෝප්පු රෝමානු කතෝලික දමිළ මිශ්‍ර පාසලෙහි දරු දැරියන් 110 සඳහා පාසල් පාවහන් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් මැයි 05 වන දින මන්නාරම සංස්කෘතික ශාලාවේදී පැවැත්විණ.

54 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ සංවිධානය කෙරුණු මෙම වැඩසටහන සඳහා සේනාංකාධිපතිගේ ඉල්ලීමකට අනුව මහනුවර ධර්මරාජ විද්‍යාලේ ආදි ශිෂ්‍ය රවී රාජපක්ෂ මහතාගේ සම්බන්ධීකරණයෙන් එක්සත් රාජධානියේ "ස්වේෂනි" සුබසාධක සංවිධානය විසින් මූල්‍ය දායකත්වය ලබාදෙන ලදී. මෙම අවස්ථාව සඳහා 54 වන පාබල සේනාංකාධිපති, 543 වන පාබල බලසේනාධිපති, මන්නාරම ප්‍රාදේශීය ලේකම්, මන්නාරම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂිකා, මන්නාරම විද්‍යාලේ විද්‍යාල්පති, ගුරුවරු, දෙමව්පියෝ, පාසල් දරු දැරියන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# වෙසක් පොහොය නිමිත්තෙන් බැති ගී ප්‍රසංගයක්






වෙසක් පොහොය දිනය නිමිත්තෙන් ප්‍රගුණ හා සැඟවුණු වෙඩිකරු පුහුණු පාසලේ රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් වෙසක් බැති ගී ප්‍රසංගක් පවත්වන ලදී. මෙම අවස්ථාවට ප්‍රගුණ හා සැඟවුණු වෙඩිකරු පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්ටිඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# වෙසක් උත්සවය අර්ථවත්ව සමරයි





සම්බුදු තෙමඟුල සිහිපත් කරමින් වෙසක් පුන් පොහෝ දින 65 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේව් සමරසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ උපදෙස් හා අධීක්‍ෂණය යටතේ එම සේනාංක බලප්‍රදේශයට අයත් 651, 652 සහ 653 වන පාබල බලසේනාවන් සහ ඊට අයත් ඒකක හටපිරිස් විසින් බෝධිපූජා පිංකම් සහ දන්සැල් සංවිධානය කරන ලදී. මෙහිදී, දිවා ආහාර පාර්සල් 340 ක් එම බලප්‍රදේශයේ පිහිටි රෝහල්වල කාර්ය මණ්ඩලය, නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් හා එම ප්‍රදේශයේ තෝරාගත් දිළිඳු පවුල් සඳහා බෙදාදීමට කටයුතු කෙරිණ.

# වෙසක් පොහොය නිමිත්තෙන් පූජාසත්කාරයක්





12 වන පාබල සේනාංකාධිපතිගේ අදහසකට අනුව පසුගිය වෙසක් පොහොය දිනයට සමගාමීව 20 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරීගේ අධීක්‍ෂණය යටතේ එම ඒකක හටපිරිස්හි සහභාගීත්වයෙන් කතරගම පුදබිම වන්දනා කිරීම සඳහා පැමිණෙන බැතිමතුන් වෙත ගෝතමීගම ප්‍රදේශයේදී රසවත් මඤ්ඤොක්කා දන්සැලක් පවත්වන ලදී.

# නිරෝගී හමුදාවක් නිරෝගී දැයක්



රාගම මූලික යුධෝපකරණ ගබඩාවෙහි රාජකාරියේ නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් 100 දෙනකු සඳහා හමුදා රාජකාරීන්හි කාර්යක්ෂමතාවයට සහ පුද්ගලික දිවි පැවැත්ම සඳහා බෝ නොවන රෝගවලින් සිදුවන බලපෑම පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් නිරෝගී හමුදාවක් නිරෝගී දැයක් අංශය විසින් ඉකුත් අප්‍රේල් 27 වන දින පවත්වන ලදී.

මෙහිදී, බෝ නොවන රෝග යන මැයෙන් එම අංශයේ විධායක සම්බන්ධීකරණ නිලධාරිනි කායික රෝග විශේෂඥ වෛද්‍ය බ්‍රිගේඩියර් ඒඑස්එම් විජේවර්ධන යූඑස්පී විසින් දේශනය සිදුකළ අතර, ආහාර පාලනය සහ එහි වැදගත්කම පිළිබඳ වූ දේශනය යුද්ධ හමුදා රෝහලෙහි පෝෂණවේදිනී ලෙස කටයුතු කරනු ලබන කපිතාන් ඒසීකේ උඩුගම නිලධාරිනි විසින් සිදුකරන ලදී.

ව්‍යායාමයෙහි ඇති වැදගත්කම පිළිබඳ කර්නල් බීඑල් රණසිංහ කේඑස්පී වෛද්‍ය නිලධාරිනී විසින් හරවත් දේශනයක් පැවැත්වූ අතර, එම අංශයේ ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් විසින් ඔවුන්ගේ සෞඛ්‍ය සම්පන්නභාවය නගාසිටුවීම සඳහා ශාරීරික අභ්‍යාස ක්‍රියාකාරකම් කිහිපයක්ද හඳුන්වාදෙන ලදී.







# ඒකක සංචාරයක්

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් 16 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සිය ප්‍රථම කඳවුරු සංචාරය ඉකුත් මැයි 05 වන දින සිදුකරන ලදී. එම සංචාරය අතරතුර රුක් රෝපණයක් සිදුකිරීම, සමූහ ඡායාරූපයකට පෙනීසිටීම සහ හමුපිරිස් ඇමතීමටද නොනම අමතක නොකළේය. තවද, එම ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සුබසාධනය වෙනුවෙන් නවතමයෙන් ඉදිකරන ලද කායවර්ධන මධ්‍යස්ථානය විවෘත කිරීමද එදින සිදුකෙරිණ. මෙම අවස්ථාවට සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රමානි 1 ලුතිනන් කර්නල් කේජීඑස්ජීකේ කුලසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# පූජා සත්කාරයක්





හපුතලේ බෙරගල මොරකැටිය විද්‍යාලයේ අවම පහසුකම් මධ්‍යයේ ඉගෙනුම ලබන දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීම සඳහා අවශ්‍ය පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 30 වන දින බණ්ඩාරවෙල මධ්‍යමහා විද්‍යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ හිටපු ටෙස්ට් හා එක්දින ක්‍රීඩකයකු හා ජාත්‍යන්තර ක්‍රිකට් තරග තීරකවරයකු වන රොෂාන් මහානාම මහතාගේ පූර්ණ අනුග්‍රාහකත්වය මත රොෂාන් විජේරාම පවුලේ පදනම විසින් දෙවන වරටත් මෙම වැඩසටහන දියත් කරන ලදී. තවද, එම විද්‍යාලයේ දරුවන් සඳහා දිවා ආහාරය පිළිගැන්වීමද, බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාල ක්‍රිකට් කණ්ඩායම සඳහා සියලු ක්‍රිකට් ආම්පන්නවලින් සම්පන්න හාඩ්බෝල් ක්‍රිකට් කට්ටලයක් ලබාදීමද එහිදී රොෂාන් මහනාම මහතා විසින් සිදුකරන ලදී. ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ මගපෙන්වීමෙන් සිදුකළ මෙම පාසල් උපකරණ ලබාදීමේ අවස්ථාවට ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# සංචාරයක මතක සටහන්



57 වන පාබල සේනාංකාධිපති බ්‍රිගේඩියර් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී විසින් පසුගියදා 572 වන පාබල බලසේනාවේ කඳවුරු සංචාරයක් සිදුකරන ලදී. එහිදී, එම පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්පීඑන්ජ් මුතුමාල යූඑස්පී පීඑස්සී විසින් උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ සේනාංකාධිපති විසින් මයිල්වානපුරම්, කල්ලාරු, තේරවිල්, පුලියන්පොක්කන්නඩි හා වඩ්ඩකච්චි යන ප්‍රදේශයන්හි භටපිරිස් හමුවී ඔවුන්ගේ ක්‍රියාත්මක හා පාලන අවශ්‍යතා සොයාබැලීය.

# දමිළ භාෂා පුහුණු පාඨමාලා අංක - 48





59 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබණ්ඩාර යූඑස්පී ගේ උපදෙස් පරිදි එම සේනාංක මූලස්ථානය යටතේ පාලනය වන ඒකකයන්හි රාජකාරී කරනු ලබන සෙනින්ගේ දමිළ භාෂාව පිළිබඳව දැනුම වර්ධනය කිරීමේ අරමුණින් දමිළ භාෂා පුහුණු පාඨමාලා අංක - 48 ඉකුත් මැයි 13 වන දින ආරම්භ කරන ලදී. මෙම අවස්ථාවට එම පාබල සේනාංක මූලස්ථානයේ කර්නල් ප්‍රමා කර්නල් එච්කේ හපුගොඩ යූඑස්ඒසීජීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# වෙසක් පොහෝ දින සිසිල් පැන් දන්සැලක්





23 වන විජයබාහු පාබල රෙජිමේන්තුව වෙතින් වෙසක් පොහොය දිනයට සමගාමීව සංවිධානය කරන ලද සිසිල් පැන් දන්සැලක් එම ඒකකය ඉදිරිපිටදී ඉකුත් මැයි 15 වන දින උදෑසන සිට ක්‍රියාත්මක කරනු ලැබීය.

## කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක්





57 වන පාබල සේනාංකාධිපතිගේ මගපෙන්වීම මත කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් 572 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්පීඑන්ජී මුතුමාල යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ආරම්භ කරන ලදී. මෙහිදී, එම පාබල බලසේනාවේ භටපිරිස් විසින් 14 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව, ධර්මපුරම් හා මුලතිව් යන ප්‍රදේශවල මෙම ව්‍යාපෘතිය මූලික වශයෙන් ආරම්භ කරන ලදී. 572 වන පාබල බලසේනාධිපතිගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම ව්‍යාපෘතිය ඉදිරියටත් දියත් කිරීමට නියමිතව ඇත.

## ප්‍රජා සත්කාරයකට උරදෙමින්






681 වන පාබල බලසේනාව යටතේ පාලනය වන 9 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු ඒකක බල ප්‍රදේශයට අයත් මු/උදයාර්කට්ටු මහා විද්‍යාලයේ නාම පුවරුව ඉදිකිරීමේ ප්‍රජාසත්කාරක වැඩසටහනක් යුද්ධ හමුදා භටපිරිස් සහ සිවිල් වැසියන්ගේ සහභාගීත්වයෙන් පසුගියදා සිදුකරන ලදී.

# දර්ශනීය ළමා උද්‍යානයක් දූ දරුවන් වෙත



55 වන පාබල සේනාංකාධිපති බ්‍රිගේඩියර් එම්කේජූපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ සංකල්පයක් මත එම සේනාංක බලප්‍රදේශයට අයත් කඩ්ඩෛයිකාඩු හි ඉදිකරන ලද ළමා උද්‍යානය ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් 26 වන දින විවෘත කරන ලදී.

දෙමාපියන්ට හා දරුවන්ට විවේකීව ගතකළ හැකි ස්වභාව සෞන්දර්යාත්මක පරිසරයක නිර්මාණය කර ඇති මෙම ළමා උද්‍යානය දරුවන්ට සුරක්ෂිත සහ යහපත් අනාගතයක් යන තේමාව යටතේ ක්‍රියාත්මක කර ඇත. මෙම උද්‍යානය තුළ ළමුන්ට හා දෙමාපියන්ට පරිශීලනය සඳහා දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්ගෙන් සමන්විත පොත්පත්, සඟරා ඇතුළත් පුස්තකාලයක්ද ස්ථාපනය කර ඇත.

# දූ දරුවන් වෙනුවෙන් පරිත්‍යාගයක්






යුද්ධ හමුදාවේ ඉල්ලීමකට අනුව *Singer Sri Lanka Private Limited* සමාගම විසින් සිදුකරනු ලැබූ අනුග්‍රාහකත්වය මත 662 වන බලසේනාවේ භටපිරිස් විසින් මුක්කම්පන් සහ අක්කරායන්කුලම් ප්‍රදේශවල ඇති පෙර පාසල් 8 ක ළමුන් වෙත සෙල්ලම් බඩු සහිත ත්‍යාග පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 27 වන දින සිදුකරනු ලැබූහ. 66 වන සේනාංකාධිපති විසින් *Singer Sri Lanka Private Limited* සමාගමෙන් සිදුකරනු ලැබූ ඉල්ලීමකට අනුව ඔවුනගේ අනුග්‍රාහකත්වය මත ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල ළමුන් වෙත එම සෙල්ලම් බඩු සහ අධ්‍යාපනික උපකරණ සහිත පරිත්‍යාග ලබාදෙනු ලැබීය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 66 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී සහභාගී විය.

662 වන බලසේනා මූලස්ථානයේ තවත් ප්‍රජා මූලික ව්‍යාපෘතියක් ලෙස දියත් කරන ලද මෙම පරිත්‍යාග වැඩසටහන එම බලසේනාව යටතේ ස්ථාපිත 20 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ සහ 20 (සේවා) විජයබාහු පාබල රෙජිමේන්තුවේ භටපිරිස් විසින් සංවිධානය කරනු ලැබූහ.

# ගැබිණි මව්වරුන් වෙනුවෙන් පරිත්‍යාගයක්



14 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් එම ඒකක බලප්‍රදේශයේ ගැබිණි මව්වරුන් 10 දෙනකු සඳහා පෝෂණ මළු සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදාදීමේ වැඩසටහනක් 641 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීපීජේසී ජයවර්ධන යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි 18 වන දින සිදුකරන ලදී. මෙම අවස්ථාවට 641 වන පාබල බලසේනාවේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී මෙන්ම 14 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් එස්අයි ප්‍රසන්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඇතුළු පිරිසක් සහභාගී වූහ.



# විනාඩි හතරක ප්‍රශ්නෙට ගෙදර මහ යුද්ධයක්

උතුරේ යුද්ධය ජය ගැනීමෙන් පසු මාසයක නිවාඩුවක් ගත කිරීම සඳහා යාපනයේ යුද්ධ පිටියේ සිට ආපසු ගම රට බලා එමින් සිටි මට පාබල හමුදාවට අයත් යුද නිලධාරියකු වශයෙන් සාමයේ සිසිල් සුළං රැල්වල මිහිරි ආශ්වාදය විඳීමට ලැබුණේ සුළු වේලාවකි. කාන්තාවකගේ මර ලතෝනි හඬත්, දඩි බිඩි ගා පහර හා ප්‍රතිපහර හුවමාරු වීමේ හඬත්, යළිත් මහා සටන් බිමකට පිවිසීමේ ත්‍රාසය මගේ සිත්හි මවා පෑවේය. එය නික්ම ආයේ මහා මාර්ගය අසල නිවසකින්ය. ප්‍රභාකරන්ගේ බංකරයට කඩා පනින්නාක් මෙන් මම ගේට්ටුව තල්ලු කරගෙන දොර කඩාගෙන එම නිවසට කඩා පැන්නෙමි.

"සටන නවත්වනු.. අර්බුධයක් ඇත්නම් සාකච්ඡා මාර්ගයෙන් එය විසඳනු"

මම අණ දෙමින් සාලයට පැන්නෙමි. එහි වූයේ කාන්තාවකගේ කෙස් වැටියෙන් අල්ලාගෙන ඇයට දවැන්ත ප්‍රහාරයක් එල්ල කරමින් සිටි හැඩි දැඩි පිරිමියෙකු බව දුටු මට ඒ නීත්‍යානුකූල අඹු - සැමි යුවළක් බව වටහා ගැනීමට අප්‍රවා ගැටපද විවරණ ටීකා අවශ්‍ය නොවීය. අඹු - සැමියෝ වනාහී සටනටම උපන් පාත්‍රවර්ගයෝය.

"මේවා සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගන්න පුළුවන් ප්‍රශ්න නොවේ. තමුසෙ කව්ද?" යි සැමියා ඇසීය.

"මම මේ එහා පාරේ..."

"මොන කවුරු උනත් අපට කමක් නෑ. මේ මගේ නීත්‍යානුකූල බිරිඳ. මට නීතියෙන් අවසරයක් තියෙනව මේකිගෙ බොටුව මිරිකල රිරි මාංශ උරා බොන්න. කාටවත් අයිතියක් නෑ අපෙ පුද්ගලික ජීවිතේට ඇඟිලි ගහන්න." සැමියා මොර දුන්නේය.

"හරි හරි මං දන්නව. අනුන්ගෙ පුද්ගලික ජීවිතයට තියා මගෙ පුද්ගලික ජීවිතයටවත් ඇඟිල්ලක් ගහන්න ඉඩ නෑ කියල. ඒ තරමටම අපේ ජීවිතේ ප්‍රශ්න ගොඩ ගැහිල හරියට ප්‍රයිවට් බස් එකෙක සෙනග පිරෙව්වා වගේ. නමුත් යුද නිරීක්ෂකයෙක් වශයෙන් මට හොඳ දෘෂ්ටි කෝණයකින් බලන්න පුළුවන් අනුන්ගෙ ප්‍රශ්න දිහා. ඒක මට ආශ්වාදයක්. දැන් පහර දෙන්න"

"ඒක හරි මඟුලක්නෙ. කාගෙවත් ආශ්වාදයට මගෙ ගෑනිට මං පහර දෙන්නෙ මොකෝ" ඔහු ඇගේ කෙස් වැටිය අතහැර මා ළඟට ආවේය.

"මේ ගෑනිගේ වැරැද්දට මං ගැහුවෙ. දැන් ඉතිං ගහල වැඩක් නෑ" කියා ඔහු දුකින් හා වෙහෙසින් හෙම්බත්ව සැටිය මත ඇද වැටුණේය මම ඔහු අසලින් වාඩි වූයෙමි ඔහුගේ බිරිඳ ඉදිරි අසුනේ වාඩි වී කෙස් වැටිය සකස් කර ගන්නට වූවාය.

"මගේ විතරක් වැරැද්ද කියන්න බෑ." ඈ හඬන්නට වූවාය.

"මට තරමන්න බෑ. උඹටයි තරමන්න තිබුණේ. මං මොකටද කියන්නෙ.. දැන් ඉතිං තව අවුරුද්දක් බලාගෙන ඉන්න එපැයි." සැමියා මුමුණන්නට විය.

"මට තේරෙන්නෙ නෑ." මම මටම කියා ගතිමි.

"එහෙනං අහගන්න." සැමියා මා ළඟට කිට්ටු විය.

"අපි දෙන්න බැඳල දැන් අවුරුදු හයක්

වෙනවා. අපිට පුතෙක් ලැබුණා. ලැබුණෙ 1991 පෙරවාරි මාසෙ 01 වෙනිදා උදේ 12.04 ට. ඒ කියන්නේ 1991 ජනවාරි 31 රාත්‍රී 12 පසුවී මිනිත්තු 04 ට. මං මේ ගැනිගෙන් අහන්නේ ටිකක් උත්සාහ කරල විනාඩි පහකට කලින් ළමයා බිහිකළා නම් මේ අවුරුද්දෙ ඒකව ඉස්කෝලෙ දාගන්න තිබුණා. මොකද ජනවාරි 31 පහුවෙන්න ඉස්සර වෙලා ළමයා ඉපදිලා තියෙන්න ඕන මේ අවුරුද්දෙ ඉස්කෝලෙට ඇඩ්මිට් කරන්න. බලන්න මිස්ටර් මේ ගෑණිගෙ විනාඩි පහක ප්‍රමාදෙට, ඒ කියන්නෙ රාත්‍රී 1159 ට ළමයා වදාගන්න බැරි උණ හින්ද ඌ: තව අවුරුද්දක් ගෙදර තපින්න එපායැ. මේ කාලෙ ඉස්කෝලෙ දමාගන්න තියෙන යුද්දෙ."

"අප්පෝ.. ප්‍රභාකරන් අල්ලන එක ලේසියි. ඉස්කෝලෙ ප්‍රින්සිපල් කෙනෙක් අල්ලනවට වැඩිය." මම සාධාරණ වීමි.

"අනේ මගෙ වැරැද්ද නෙමේ." බිරිය මා ළඟින්ම වාඩි වී කරුණු පැහැදිලි කරන්නට වූවාය. "ළමයා බඩට ආපු හැටියටනෙ කාලෙ සම්පූර්ණ වෙලා ලේබර් පේන්ස් ඇවිල්ලා හම්බුවෙන්නේ. අනික් අතට දැං ළමයි හම්බු වෙන්නේ අපිට ඕන වෙලාවට නෙමේ ස්පෙෂලිස්ට් කියන වෙලාවට."

"ඔව්. ඉස්සර නං නක්ශාස්ත්‍රකාරයන්ට ඕන වෙලාවට. දැං ස්පෙෂලිස්ට්ලට නිදහස තියෙන වෙලාවට." මම අලගු තැබුවෙමි.

"ඔව්. උඹට මාස නවය හමාරක් බඩේ තියාගෙන ඉන්න පුළුවන්. ඔය විනාඩි 4 ළමය වෙනුවෙන්, මං වෙනුවෙන්, උගේ අධ්‍යාපනය වෙනුවෙන්, රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය වෙනුවෙන්, කලින් බිහි කරන්න බෑ." සැමියා ගොරවන්නට විය.

"හොඳයි. ළමයා කොහෙද ඉපදුනේ? ගෙදරද?" මම ඇසීමි.

"නෑ. ඉස්පිරිතාලෙ" සැමියා කීය.

"ඉස්පිරිතාලෙ නොවේ. ප්‍රයිවට් හොස්පිටල් එකේ. බිල රුපියල් 16,000 ක් වුණා." බිරිඳ කඳුළු පිසදමා සිනාමුසුව පැවසුවාය.

"ඒ ණය තවමත් පඩියෙන් කැපෙනවා. ඒ කරලත් ළමය ඉස්කෝලෙ දා ගන්න බැරිවුණා. විනාඩි 4 හින්දා." සැමියා කීය.

"ළමයා ගෙදර හම්බුවුණා නම් ස්වභාවික දරු උපතක්, නක්ෂත්‍රය අනුව, රජයේ රෝහලක නම් ඇඳන්වල ඉඩ නැති හින්දයි, කංකානම් අම්මලාගේ සහ නර්ස්ලගේ සැර හන්දයි කලින් ඉපදෙන්න තිබ්බා." මම කීවෙමි.

"ඒක නේන්නම්. මේ ගෑණිගෙ ලොකුකම හින්දනෙ බිල වැඩි කරගන්න උන් හිතලම ප්‍රමාද කරලා. එහෙම නැත්තං මේ ගෑණි හිතලම ප්‍රමාද කරල. නැයින්ටයි, යාළුවොන්ටයි පේන්න වැඩියෙන් ප්‍රයිවට් හොස්පිටල් එකේ ඉන්න."

"අනේ නෑ. ඩොක්ටර් කීවෙ සීසර් කරල ගමු කියලා. දැං ඒකනෙ පැෂන් එක. කෝ ඔයානේ එපා කීවේ ඔපරේෂන් එකට ගොඩක් චාජ් කරයි කියලා." බිරිඳ කීවාය

"මං හිතුවෙ සීසර් කරන්න ඉස්සර වෙලා ඔයාට නිකම්ම බබා හම්බුවෙයි කියල. බිල නගින වේගෙට බයේ." සැමියා හරස් කැපීය.

"කොහොම හරි මේක ස්වභාවික උපතක්." මම කීමි. "ඒ හින්ද ළමයා ලැබුණේ පිළිසිඳ ගත්ත දවස අනුවයි. ඉතිං මට දොස් කියල හරියැ." බිරිඳ අවලාද කීවාය. "ඒකට වග කියන්න ඕනෙ ඔයා."

"මං වැරැදිකාරයා නොවේ. අපි බැන්ද දවසෙමයි පිළිසිඳ ගැනීම සිදුවුණේ."

"නමුත්, දැන් සමහරක් තැන්වල කෙරෙන පරිදි බඳින්න ඉස්සර ළමයා පිළිසිඳ ගත්තනම්, මේ ප්‍රශ්නෙ ඇති වෙන්නෙ නෑ." මම කීවෙමි.

"මගේ විරුද්ධත්වයක් තිබුණේ නෑ." සැමියා කීය

"පිරිමි විශ්වාස නෑ. එහෙම වුණොත් සමහරවිට නැති කරගන්න කියල මෙයා බල කරන්නත් තිබුණ." බිරිඳ සාලයෙන් පිටවූවාය.

"හොඳයි එහෙනං, කලිං මගුල ගත්තනම්, ළමය කලිං ඉපදෙන්න තිබුණනේ" මම කීවෙමි.

"නැකතක් තිබුණෙ නෑ."

"ඊට කලින් මාසෙ."

"එතකොට අපි මුණගැහිලවත් නෑ."

"මුණු ගැහුණේ."

"මගෙ යාළුවකුගේ මගුල් ගෙදරකදී මනාලියගෙ බ්‍රයිඩ්ස් මේඩ්ලගෙන් එක් කෙනෙක් විදිහටයි මෙයා ආවෙ."

"ඒ කියන්නෙ ඔහේගේ යාළුව කලින් බැන්ද නම්, ඔය දෙන්න කලිං හම්බුවෙලා, කලින් සෙට්වෙලා, කලිං ළමයා පිළිසිඳ ගෙන කලින් හම්බු වෙන්න තිබුණනෙ." මම කීවෙමි.

"ඔව්."

"එතකොට ඒ යාළුවා කව්ද?"

"එයා හමුදාවේ වැඩ කරන කෙනෙක්. එයා කලින් බඳින්න දින නියම කරගෙන හිටියෙ. නමුත් හදිස්සියෙම ත්‍රිකුණාමලේ සටන් ආරම්භ වෙලා, නිවාඩු කැන්සල් වෙලා එයාට ඩියුටි යන්න වුණා."

"මේක සිද්ධ වුණේ මීට අවුරුදු හය හතකට ඉස්සර."

"ඔව් ගිය ආණ්ඩුව කාලේ."

"එතකොට ගිය ආණ්ඩුව කොටි සමග සාම සාකච්ඡා පවත්වද්දී ඔවුන් ආණ්ඩුව රවට්වලා පහර දුන්න හින්ද යාළුව සටනට කැඳෙව්වා."

"ඔව්."

"එයින් ඔහුගෙ මගුල කල්ගිය නිසා තමන්ට තම සහකාරිය හමුවීම ප්‍රමාද උණා."

"ඔව්."

"එයින් තමන් අතර විවාහය ප්‍රමාද වෙලා, පිළිසිඳ ගැනීම ප්‍රමාද වෙලා, දරුවා ජනවාරි 31 දා දොළහ පසුවී විනාඩි 4 ට උපන් නිසා ළමයා මේ අවුරුද්දේ පාසලට භාරදෙන්න බැරි උණා."

"ඔව්."

"එයින් තේරෙන්නේ මේ දරු ප්‍රසූතිය විනාඩි 4 ක් ප්‍රමාද උණේ තමන්ගේ බිරිඳගෙ නොවේ, ගිය ආණ්ඩුවෙ වරදින් කියන එක තමා පිළිගන්නවාද?"

"ඔව්."

"එහෙනං බිරිඳට එන්න කියල, එයාට දොස් පවරල ගැහුවට සමාව ඉල්ලලා, දෙන්නා සාමයෙන් සමාදානයෙන් කල් ගෙවන්න." මම අවවාද කළෙමි"

"ඩාලිං, මෙහෙ එන්නකො පොඩ්ඩක්." සැමියා සුරතල් වූයේය.

"ඇයි වස්තුව?" කියා බිරිඳ තේ කෝප්ප දෙකක්ද රැගෙන සාලයට ආවාය.

"අනේ මට දුකයි සුදූ. ඔයාට දොස් පවරල ගැහුවට. දැං බලාන යනකොට

විනාඩි 4 ප්‍රශ්නෙට වැරදිකාරයා ඔයා නොවේ."

"එහෙනම්."

"පසුගිය ආණ්ඩුව. මට සමාවෙන්න."

"සමාවෙන්න" ඇය අමුතු ස්වරයකින් ප්‍රතිරාවය කළ ඈ තේ කෝප්ප දෙක පොලවේ ගසා අසල තිබූ කොස්ස අතට ගෙන වියරු වූ යක්ෂණියක් සේ, "ගොනා, බල්ලා, බූරුවා, ගොන් තඩියා තෝ ගිය ආණ්ඩුවේ වැරැද්දට නිරපරාදේ මට වැරැද්ද පැටෙව්වා. තොගෙ අඩු කඩනවා. මී හරකා" කියමින් සැමියාට පහර දෙන්නට වූවාය.

"මෙන්න මා මරණවෝ. මාව බේරගන්න කවුරුත් නැද්දෝ"යයි මර හඬ දෙමින් සැමියා සාලයේ ඒ මේ අත දුවද්දී මම ජනේලයෙන් එළියට පැන දුවන්නට වූයෙමි. අපට පුරුදු පිරිමින් නිරායුධ කිරීම විනා ගැහැණුන් නිරායුධ කිරීම නොවේ. අමු - සැමි සටන්වලට මුහුණ දෙනවාට වඩා ප්‍රභාකරන්ට මුහුණදීම ලෙහෙසිය.

මම කෙලින්ම යාපනය බලා පිටත් වූයෙමි.

***චන්ද්‍ර අතාභිරත්නගේ "තරලොව හොල්මන්" කෘතිය ඇසුරිනි.***

# සංචාරයක සටහන්





ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් ඉකුත් මැයි 27 වන දින 144 වන පාබල බලසේනාවෙහි සහ ඒ යටතේ ඇති 2(සේවා) ශ්‍රීලපාහ ඒකකයේ කඳවුරු සංචාරයක නිරත විය. මෙම සංචාරයේදී එහි නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ පාලන අවශ්‍යතා පිළිබඳව සොයාබැලූ හෙතෙම එම භටපිරිස් ඇමතීමටද අමතක නොකළේය. එම අවස්ථාවට 14 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීජීඑස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී හා 144 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්ව් කොඩිතුවක්කු ද එක්වූහ.

# ඒකක සංචාරයක්






ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති මේජර් ජෙනරාල් ජීඩබ්ලිව්එල් මාහින්කන්ද සිය තනතුරෙන් සමුගැනීම හා විශ්‍රාම යාම නිමිත්තෙන් ඉකුත් මැයි 21 වන දින 4 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය වෙත නිල සංචාරයක් සිදුකරන ලදී. එහිදී, ඒකක මූලස්ථානය වෙත පැමිණි ආඥාපති පිළිගැනීම 4 ශ්‍රීලයුපොසේබ අණදෙන නිලධාරී මේජර් එම්එච්කේඑන් පද්මාල් යූඑස්පී එල්එස්සී විසින් සිදුකරන ලද අතර, කඳවුරු සම්මාන මුරයක්, පැළ රෝපණයක් හා සියලු නිලයින් ඇමතීමක් එම සංචාරයේ වැඩසටහන් අතරට එක්ව තිබිණ.

# රංගකලා පාසලෙහි පාඨමාලා හැදෑරූ හටපිරිස් විසිර යති





2021.05.23 වන දින සිට 2022.05.20 වන දින දක්වා යුද්ධ හමුදා සංගීත හා රංගකලා පාසලෙහි පවත්වන ලද මූලික තූර්යවාදක පාඨමාලා අංක - 22 හා නායක තූර්යවාදක පාඨමාලා අංක - 23 හි සහතිකපත් ප්‍රධානෝත්සවය යුද්ධ හමුදා තූර්යවාදක හා රංගකලා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ආර්බී බෙන්ජමින් ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී, පාඨමාලා අවසන් කළ පිරිස අතරට මූලික තූර්යවාදක පාඨමාලා අංක - 22 හැදෑරූ සෙසුනිලයින් 36 දෙනකු හා නායක තූර්යවාදක පාඨමාලා අංක - 23 හැදෑරූ සෙසුනිලයින් 10 දෙනකු ඇතුළත් වූහ.

# 35 වසරක අභිමානවත් ගමන්මග





වර්ෂ 1987 ක්වූ මැයි මස 05 වන දින ත්‍රිකුණාමලය මංකිබ්‍රිජ් යුද හමුදා කඳවුරේදී ලුතිනන් කර්නල් යූඑ් ගුණවර්ධන පීඑස්සී ගේ නායකත්වය හා මග පෙන්වීම යටතේ ස්ථාපනය කරන ලද 4 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වර්ෂ 2022 ක්වූ මැයි 05 වන දින සිය අභිමානවත් 35 වන බළඇණි දිනය සමරනු ලැබීය.

එදාමෙදාතුර මෙම බළඇණිය පැමිණි ගමන්මග දෙස හැරී බැලීමේදී දශක තුනක් පුරා පැවති රුදුරු ත්‍රස්තවාදය මාතෘ භූමියෙන් මුලිනුපුටා දැමීම උදෙසා දක්වන ලද සක්‍රිය දායකත්වයේදී නිලධාරීන් 23 දෙනකු සහ සෙසුනිලයින් 357 දෙනකු තම අවසන් සුසුම් වාතලයට මුසුකරනු ලැබ ඇත. එසේම නිලධාරීන් 51 දෙනකු හා සෙසුනිලයින් 1363 දෙනකු රණකපිනයට පත්වූහ. යුද්ධ හමුදාධිපතිගේ අතිරේක ප්‍රහාරක බළඇණියක් වශයෙන් 1 වන බලකාය යටතේ ක්‍රියාත්මක මෙම බළඇණිය 53 වන පාබල සේනාංකයට අනුයුක්තව 532 වන පාබල බලසේනාව යටතේ ඕනෑම හදිසි අවස්ථාවකට මුහුණදීම සඳහා සූදානම්ව අම්පාර දිස්ත්‍රික්කයේ එරගම නොරෝච්චෝලේ ස්ථානගතව ඇත.

බළඇණි දින සැමරුමට සමගාමීව ඒකකයේ වත්මන් නියමුවාණන් වන ලුතිනන් කර්නල් ඩබ්ලිව්ඩීආර් වීරපුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් මාතෘ භූමියේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීම උදෙසා ජීවිත පූජාකළ සහ රණක්ෂිතයටපත් රණවිරුවන් උදෙසා අගමික වැඩසටහන් මාලාවක් සිදුකරන ලදී. එහිදී, ඒකක සාමාජිකයින් 150 දෙනකුගේ සහභාගිත්වයෙන් ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම විශේෂ විය.

තවද, අම්පාර දුටුගැමුණු ප්‍රාථමික විද්‍යාලයේ ඉගෙනුම ලබන දූ දරුවන් සඳහා දිවා ආහාර වේලක් ලබාදීම, පාසල් උපකරණ පිරිනැමීම, අණදෙන නිලධාරී වෙත කඳවුරු සම්මාන මුරයක්ද පිරිනැමීම සංවත්සර වැඩසටහන් අතර කැපී පෙනුණි. එසේම ඒකකයේ සියලුම නිලයන්ගේ සහභාගීත්වයෙන් කෙසෙල් පැළ 250 ක් රෝපණය කිරීමද සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීමද සන්ධ්‍යා භාගයේදී ඒකකයේ කණ්ඩායම් අතර සහයෝගීතාවය වර්ධනය කිරීමේ අරමුණින් පැවැත්වූ මලල ක්‍රීඩා තරගාවලියක්ද සංවත්සර දින වැඩසටහන් වර්ණවත් කරලීය.



# කොතලාවල නාමයේ අතීත පිරික්සුම

ජෙනරාල් සර් ජෝන් කොතලාවල, එසේත් නැතිනම් ජෝන් ලයනල් කොතලාවල යන නාමය සමස්ත යුද්ධ හමුදාවට නුහුරු නුපුරුදු නමක් නොවන බව අප කවුරුත් හොඳින් දන්නා කරුණකි. එතුමන් නිදහස් ලංකාවේ තුන්වන අග්‍රාමාත්‍යවරයා වශයෙන්ද කටයුතු කර ඇත. රටේ නමක් තැබූ මෙම කොතලාවල නාමය මෙරට පමණක් නොව විදේශ රාජ්‍යයන් අතරද කීර්තියට අග නැන්පත් විශේෂ නාමයක් වූ හෙයින් මෙම කොතලාවල නාමයේ විකාශනය පිළිබඳ මඳක් විමසා බැලීම වටී.

කොතලාවල නාමය ඉතිහාසගත සිදුවීම සමඟ සම්බන්ධ, වීරකම් පෑදනම් කරගෙන ප්‍රදානය ලද නාමයක් බවට ඉතිහාසය සාක්ෂි දරයි.

එක් සිදුවීමක් රාජසිංහ රජ සමය තෙක් දිවයයි. එනම්, ඒ රජ සමයේ එක්තරා කෝවිලක කොත, අදෘශ්‍යමාන ලෙස කඩා දැමීම කිසිවකුටත් නතරකර දැමීමට නොහැකි වූ අවස්ථාවක, රජුට හිතවත් වික්‍රම නම් සෙනෙවියකු විසින් එම අදෘශ්‍යමාන ක්‍රියාව නතර කර ඇත. බොහෝ සතුටට පත් රජු මෙම සෙනවියාට ගෞරවයක් ලෙස කොතලාවල යන වීර නාමය ප්‍රදානය කරන ලදී. ඔහුගෙන් පසු ඔහුගේ දෙවන මුනුබුරකුටද මුකවෙටි තනතුරක් ද පිරිනමා ඇත. ඔහු දොලොස්වෙල කොතලාවල මුකවෙටි ලෙස ප්‍රසිද්ධව ඇත.

වීර ක්‍රියා සමඟ පෙරට පැමිණි, කොතලාවල පරපුරේ තවත් පුරුකක් ලෙස දොන් ආරොන් කොතලාවල හැඳින්විය හැකිය. එතුමා කළුතර තොටමුනේ නොතාරිස් ධූරයට පත් වූවකි. එතුමන් හට පුතුන් අට දෙනෙකි. කොතලාවල පරපුරේ අභීත රණකාමීත්වය සනිටුහන් කරමින් ජන්මය ලද්දේ වැඩිමහල් පුතු වූ ජෝන් කොතලාවලය. (සර් ජෝන් කොතලාවලගේ පියා)

1864 දී උපත ලද ජෝන් කොතලාවල කුඩා කළ සිටම විප්ලවීය ගති ඇති දරුවකු විය. කොළඹ රාජකීය, ශාන්ත තෝමස් සහ වෙස්ලි විද්‍යාලවලින් අධ්‍යාපනය ලද ජෝන් කොතලාවල මහතා පොලිස් සේවයටද එක් වී ඉතා දක්ෂ ලෙස තම රාජකාරිය ඉටුකර කීර්තිමත් පොලිස් නිලධාරියකු ලෙස මෙරට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයාගේ ද ප්‍රසාදය දිනාගෙන ඇත. මෙම යුගයේ ලංකාවේ මහා ධන කුවේරයන් අතර ඉහළින්ම වැජඹුණු අයකි "ඩී.ජී. ආටිගල". විශාල ප්‍රමාණයෙන් ඉඩකඩම් හා තවත් බොහෝ වස්තු සම්භාරයක් හිමි ආටිගල වලව්වේ වැඩිමහල් දියණිය වූ ඇලිස් ආටිගල, ජෝන් කොතලාවලයන්ගේ ජීවන සහකාරිය වී දරුවන් තිදෙනකු ලද්දාය. ජෝන් ඇලිස් ආදරණීය පවුලට ලද දූ පුතුන් වන්නේ, ජෝන් කොතලාවල (සර් ජෝන් කොතලාවල), ජස්ටින් කොතලාවල (සෙලින්කෝ අධිපතිව සිටි ලලිත් කොතලාවලගේ පියා) හා ෆ්‍රීඩා කොතලාවල වූ ඇය පවුලේ බාලයා වූවාය. කොළඹ කොටහේන, ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයෙහි පිහිටි මසංගස් හන්දියේ රාත්‍රි කාලයේ අනවසරයෙන් පවත්වාගෙන ගිය නෙයින තම්බි හෙවත් නෙයිනගේ සූදුපොළ වටලා, අප රටේ ඉතිහාසයට කිසිදා අමතක නොවන අලුත් පිටුවක් එක් කළ සාජන් මේජර් කොතලාවල ජීවිතයේ එක්තරා අඳුරු සන්ධිස්ථානයකදී ගත් වැරදි



තීරණයක් නිසා අභාග්‍ය සම්පන්න ඉරනමකට මුහුණදී ජීවන ගමනේ අවසානය සනිටුවහන් කලේ මෙරට සමාජයේ තවත් එක් කියමනක් ද සමාජගත කරමිනි.

ජෝන් කොතලාවල (ජ්‍යෙෂ්ඨ) මහතාගේ අභාවයෙන් පසු ආරියපාල අනවරත්න මහතා විසින් එතුමාගේ ජීවන චරිතය සකස්කොට ප්‍රසිද්ධ කළ බව හා කොතලාවල පරම්පරාවේ ආදිම පීතෘවරයා පිළිබඳ එම ජීවන චරිතයේ එන 335 වැනි කවියේ සිට 357 වැනි කවිය දක්වා විස්තර කෙරෙන බවත්, ඒ.ඩී.ඒ ගුණවර්ධන මහතා විසින් සම්පාදන කර 1939 දී කොළඹ මහා බෝධි යන්ත්‍රාලයේදී මුද්‍රණය කර ප්‍රකාශයට පතකරන ලද, "ජෝන් කොතලාවල චරිතාපදානය" නම් කෘතියේ සැකෙවින් දක්වා ඇත.

ඉතිහාසයේ සිටම වීරකම් සනිටුහන් කරමින් පැමිණි කොතලාවල පරපුරේ තවත් පුරුකක් ලෙස ජෝන් ලයනල් කොතලාවල මහතා 1897 දී උපත ලැබිය. සර් ජෝන් කොතලාවල මැතිතුමා කලක් බ්‍රිතාන්‍ය රාජකීය හමුදාවේද සේවය කර පසුව හමුදා සේවයෙන් ඉවත් වී දේශපාලන ප්‍රවාහයට පිවිසී, 1947 දී පළමුවන ලංකා පාර්ලිමේන්තු මැතිවරණයට දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයෙන් තරගකර පාර්ලිමේන්තුවට තේරිපත්වී, පසුව නිදහස් ශ්‍රී ලංකාවේ තුන්වන අග්‍රාමාත්‍යවරයා ලෙස (1953-1956) කටයුතු කරන ලදී. සර් ජෝන් කොතලාවල මහතා විවාහ වූයේ රටේ තවත් වැදගත් පවුල් පෙළපතකින් පැමිණි මන්ත්‍රී ඩයස් බණ්ඩාරනායක සමඟ වූ අතර, මෙම දෙපළට ලද එකම දියණිය වූයේ ලක්ෂ්මී කොතලාවලය.

1980 ඔක්තෝම්බර් මස හදිසියේ ඇති වූ හෘදයාබාධයක් හේතුවෙන් රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් ජීවන චාරිකාව නිමා කිරීමට අවසාන සමයට ආසන්නව මරණ මංචකයේ සිටි එතුමාගේ සුවදුක් බැලීමට පැමිණි එවකට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා විසින් සර් ජෝන් කොතලාවල මහතාගේ සේවය අගය කරමින් තරු හතරේ ගෞරවණීය ජෙනරාල් තනතුරක් පිරිනමන ලදී. පසු දින එනම්, 1980 ඔක්තෝම්බර් මස 2 වන දින එතුමන් අභාවප්‍රාප්ත වූ පුවතින් රටම සෝ සුසුම් හෙළූ දිනයක් වූ බවට එකළ පුවත් පත් වාර්ථා මගින් පලකරන ලදී.

*මේජර් එම්පී සාලින්ද පීඑස්සී ශ්‍රීලකාහ*
*මාහි II (මූල්‍ය කළමනාකරණ හා ප්‍රසම්පාදන)*
*පර්යේෂණ විශ්ලේෂණ යෝජනා හා සංවර්ධන අංශය.*

# රෝහල් වාට්ටුවක් අංගසම්පූර්ණ ලෙස පිළිසකර කෙරේ





බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උපදෙස් පරිදි 141 වන පාබල බලසේනාවේ අධීක්ෂණය යටතේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිවුලපිටිය දිස්ත්‍රික් රෝහලට අයත් *COVID* - 19 රෝගීන් සඳහා වෙන්වූ සාමාන්‍ය වාට්ටුවක් අංගසම්පූර්ණ ලෙස ප්‍රතිසංස්කරණය කර 2022 අප්‍රේල් 20 වන දින රෝහල් කාර්ය මණ්ඩලය වෙත භාරදෙන ලදී.

6 වන ක්ෂේත්‍ර රෙජිමේන්තු ශ්‍රී ලංකා කාලතුවක්කු භටපිරිස් සහ 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තු භටපිරිස් ඊට තාක්ෂණික සහ ශ්‍රම දායකත්වය ලබාදුන්හ. මෙම උතුම් කර්තව්‍යය සාර්ථක කරගැනීම සඳහා *MAS Active Nirmana Pvt Ltd* විසින් අරමුදල් සහ සම්පත් ලබා දෙන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 141 වන පාබල බලසේනාවේ බ්‍රිගේඩියර් එස්පීජී ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, *MAS Active Nirmana Pvt Ltd* හි මානව සම්පත් සහ තිරසාර ව්‍යාපාර පිළිබඳ අධ්‍යක්ෂ ලොකුගේ මහත්මිය ද සහභාගී වූහ. 141 වන පාබල බලසේනාවේ මාණ්ඩලික නිලධාරීන්, 6 වන ක්ෂේත්‍ර රෙජිමේන්තු ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරි, *MAS Active* නිර්මාණ පුද්ගලික සමාගමේ නිලධාරීන් සහ දිවුලපිටිය දිස්ත්‍රික් රෝහලේ කාර්ය මණ්ඩලය කිහිප දෙනකුද මෙම අවස්ථාවට එක්වූහ.

# ජ්‍යෙෂ්ඨ නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාව - අංක 38





යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත යුද්ධ හමුදාවේ බලලත් නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන්ගේ පුද්ගලික හා සාමූහික නායකත්ව දැනුම වර්ධනය කර යුද්ධ හමුදා අණපනත් හා නියෝග තුළින් බුද්ධි මට්ටම ඉහළ නංවමින් තම යටත් පිරිස කාර්යක්‍ෂමව මෙහෙයවීමට අවශ්‍ය දැනුම වර්ධනය කිරීම සඳහා අම්පාර සටන් පුහුණු පාසල වෙතින් "ජ්‍යෙෂ්ඨ නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාව - අංක 38" පසුගිය අප්‍රේල් 01 වන දින සාර්ථකව අවසන් කරන ලදී. එම පාඨමාලාව සඳහා යුද්ධ හමුදාවේ සියලුම රෙජිමේන්තු මධ්‍යස්ථාන යටතේ ඇති නිත්‍ය සහ ස්වේච්ඡා ඒකක වෙතින් සිසු සිසුවියන් 90 දෙනකු සහභාගී වූ අතර, මෙම පාඨමාලාවෙහි සමාප්තිය සනිටුහන් කරමින් අවසන් දේශනය එම පුහුණු පාසලෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ජේඑම්ආර්එන්කේ ජයමාන්න ආර්ඩබ්ලිව්පී විසින් සිදුකරනු ලැබීය. එහිදී, සේනාවිධායක විසින් විශිෂ්ට සාමාර්ථයක් ලබාගත් පාඨමාලාවේ ප්‍රථමයා හා දක්‍ෂතම සිසුවා වන 3 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවට අයත් සෙ/752311 ඔනි 11 කරුණාදාස ඒඒඑස්ආර්කේ යන බලලත් නිලධාරී වෙත සහතිකපත් පිරිනමන ලදී.

# දෙස නැගුමට නව බළඇණි දෙකක්





යුද්ධ හමුදාධිපතිගේ සංකල්පයක් මත ආරම්භ කරන ලද කෘෂිකාර්ම හා පශු සම්පත් බලකාය අද වනවිට හරිත කෘෂිකර්මාන්තය නගාසිටුවීම උදෙසා ජාතික කර්තව්‍යයක නියැලී සිටී. ඒ යටතේ දිවයින පුරා මහාපරිමාණ වගා ව්‍යාපෘති දියත් කරමින් ජාතික ආර්ථිකය සවිබල ගැන්වීමෙහිලා ලබාදෙනුයේ මහගු දායකත්වයකි. එම කටයුතු තවදුරටත් ශක්තිමත්ව පනගැන්වීමේ අරමුණින් නව බලකා දෙකක් පසුගියදා ස්ථාපිත කෙරිණ. ඒ අනුව උතුරු ප්‍රදේශය ආවරණය කිරීම සඳහා ලුතිනන් කර්නල් ඒඑස්බී හපුවින්න යූඑස්පී පීඑස්සී ගේ අණදීම යටතේ 6 වන කෘෂිකාර්ම හා පශු සම්පත් බලකාය ද කිලිනොච්චි ප්‍රදේශය ආවරණය කිරීම සඳහා ලුතිනන් කර්නල් ඩබ්ලිව්පීකේ සමරනායක පීඑස්සී ගේ අණදීම යටතේ 5 වන කෘෂිකාර්ම හා පශු සම්පත් බලකාය ද ආරම්භ කරන ලදී. කෘෂිකර්ම හා පශු සම්පත් බලකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ගේ මඟපෙන්වීම මත එම ඒකක විසින් මේ වනවිටත් විශාල භූමි ප්‍රදේශයක් සාර්ථක ලෙස වගා කටයුතු අරඹා ඇත්තේ දෙස සුරකින දෑත්වලින් දෙස ගොඩනගන අපූරුව ආදර්ශමත්ව පෙන්වා දෙමිනි.

# ENGLISH Vision...

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Will you

**"කරමුකෝ"** යන අර්ථය සහිතව තරමක් අවිධිමත් භාවිතයක් ලෙස සංවාදයේ යොදාගත හැකි වාක්‍ය රටාවක් ලෙස මෙය හඳුනාගනිමු.

***Fomular*** :- සූත්‍රය

**Verb + will you, please**
වර්බ් + විල් යූ ප්ලීස්.
කර්තෘ + අන්දැකීම් ඇති බව,
ක්‍රියාපදය + කරමුකෝ.

***Ex*** / උදා :-

1. Go will you, please.
   ගෝ විල් යූ, ප්ලීස්.
   යමුකෝ අනේ.

2. Come here will you, please.
   කම් හියර් විල් යූ ප්ලීස්.
   මෙතනට එන්නකෝ අනේ.

3. Try will you, please.
   ට්‍රයි විල් යූ ප්ලීස්.
   උත්සහ කරන්නකෝ.

4. Drink some tea will you, please.
   ඩ්‍රින්ක් සම් ටී විල් යූ ප්ලීස්.
   තේ ටිකක් බොන්නකෝ අනේ.

***Nota Bene*** / සැ.යු :-

මෙම වාක්‍යය රටාව භාවිත කිරීමේ දී පහත කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

- **will you, please :-** "කරන්නකෝ අනේ" යන අර්ථ සහිත ඉහත පෙන්වා දී ඇති පරිදි මෙම වාක්‍ය කණ්ඩය ක්‍රියා පදයෙන් අනතුරුව වාක්‍යයේ අගට භාවිත වේ. මෙය අවිධිමත් භාවිතයක් වන බැවින් එදිනෙදා සංවාදයේ ඉතා සමීපතමයන් සමඟ පමණක් භාවිත කිරීම ඉතා යෝග්‍ය වේ.

- **Verb :-** ක්‍රියා පදය ක්‍රියා මූල අවස්ථාවක් ලෙස මෙහි භාවිතා කිරීම අනිවාර්යය වේ.

**Verb + will you, please**
වර්බ් + විල් යූ ප්ලීස්.
කර්තෘ + අන්දැකීම් ඇති බව,
ක්‍රියාපදය + කරමුකෝ.

Come here will you, please.
කම් හියර් විල් යූ ප්ලීස්.
මෙතනට එන්නකෝ අනේ.

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද, ඔබට මගහැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



මේජර් චමින්ද ලියනගේ
ශ්‍රීලංකා පොලිසිය
ජනමාධ්‍ය අංශ - යුගමු
*www.englishvision.lk*




### දයාබර හිත...

නුඹ හුගක් පරිස්සම් වෙන්න
ආයෙත් දුක් විඳින්න
එපා කාටවත් ආදරෙ කරන්න

දැනන් එහෙම
ආදරෙ බිඳක් හරි
නොදැනුනා සේ හිත
ගලක් කරගන්න

නොදක්කා සේ
අහකම බලන්න
මේ තත්පරයේ විතරක් ජීවත් වෙන්න
එපා මහ දුර අනාගතය ගැන හිතන්න
මගේ සිත අවසර නෑ නුඹට
අයිති නැති තැන්වල ආදරේ සොයන්න
ඉතින් නුඹත් අනෙක් අය වගේම ගලක් වෙන්න

සෙ/279413
සැරයන් සේනාරත්න ඊටීඑස්
7 ශ්‍රීලංසිං

### තත්පරයක් වටිනා ජීවිත...

ජීවිතය ගෙවී යන්නේ වයසත් එක්කම
ළමාවිය යෞවනය මහළු වියත් එක්කම
ඉතින් අපි මියයයි දිනක
අතීතයේ හැමදේම අතහැර
තත්පරයක් වටින බව වැටහෙයි දවසක නුඹට
අවබෝධ කරන් ජීවිතය කුමක් ද යන්න
විඳින ජීවිතයට හිත තබා
විඳින්න මුළු ජීවිතයම...

සෙ/281832
කෝප්‍රල් කරුණාරත්න
7 ශ්‍රීලංසිං

### ගුරු මෑණියනි...

මා පිය සෙනෙහසේ ගඟුලෙන් මිදී
අකුරට ගියදා
සිප් සතර ලඟා කළ තනි වී
සිප් සයුර තරණය කරනට
එතෙර සිට අත දිගුකොට
නිති වෙර දරනා
ගුරු මෑණියනේ
වඳිමි ඔබ පා පියුම්...

සෙ/2120598
ආසෙ පියුමාල් එච්එම්එස්ආර්
7 ශ්‍රීලංසිං

### මිනිස්සු...

දරාගන්න බැරි දුකක් දැනුනම
අඬන්නෙ සංවේදී මිනිස්සු
ඒ දුක හංගන්න හදන්නේ
ධෛර්යමත් මිනිස්සු
දුක අමතක කරන්න වෙහෙසෙන්නේ
උත්සාහවන්ත මිනිස්සු
දුකට පිළියමක් හොයන්නේ බුද්ධිමත් මිනිස්සු
ඒත්...
දුක හිතේ හිරකරගෙන
කඳුළු නොපෙන්වා හිනාවෙලා ඉන්නේ
මේ ගුණ සේරම තියෙන මිනිස්සු

සෙ/368414
සැරයන් සුමනසේකර එච්ආර්ඩීඑි
8 ශ්‍රීලංසිරෙ

### සෙබළ හිත...

එකම තිල ඇඳුම දවස් ගාණක් ඇඳගෙන
යොදුන් ගාණක් ඇවිද්දා
ඝන කැළෑ මැදින්
අවුරුදු පහක් තියාගන්න
රසායනික එකතු කරපු
බත් පැකට් එකු කුසට විතරක් හිතට රස නෑ
ගස් ගල් යට නින්ද
දවසට පැය තුන හතරක් වුනාට
අසෑපිය වුනේ හරියටම හැයයයි
ජීවිතෙන් අඩකට වඩා රට වෙනුවෙන් කැපවෙලා
ගනි අරින්නත් කලින්
උඹල මොනවද කෑල් කියල අහනකොට...

සෙ/15ඊ01649
සැරයන් රාජපක්ෂ එච්එම්ඩීවී
15 ශ්‍රීලංසිරෙ

### අහිමි නුඹට...

තනිකමින් පාළුවෙන් දුකින්
ලතැවුණු සිතට ආදරෙන්
මගේ සිතේ පහන් සිල වූ නුඹට
තව තවත් ලංවෙන්න
මට බයයි කියන්නට
දයාබර පහන් සිල නුඹයි
මගෙ මුළු ලොවම සීතල ජල බිංදුවක්
මගේ සිත නිරතුරුව
තවත් ලං වුනොත් නුඹට
අනේ නුඹ නිවී යයි
සතුටකින් නිදහසින් දිලෙන
දිලුන නුඹේ ජීවිතය
දුරින් හිඳ ආදරෙන්
බලා ඉන්නම් නිබඳ
ජීවිතය කියාදුන් ආදරේ අරුත දුන්
නුඹ ළඟින් හැමදාම
සිටින්නම් සෙනෙහසින්
නුඹට තව ලංවෙන්න
මට සිතෙයි හැමදාම
දයාබර සෙනෙහසක් තුරුළු කරගෙන හදට
නුඹට තව ලංවුනොත්
මගේ මේ තුන් හිතම තව තවත් දැවී යයි
තනිකමින් හැමදාම
කණාමැදිරියක් මම තවත් එළිය සොයන
දුරින් හිඳ නුඹේ එළිය ලබා ගන්නම් නිබඳ

සෙ/ආර්00492 ලා/කෝ අනුරුද්ධිකා ඩබ්එස්
5 ශ්‍රීලයුකාබ

### සඳ කුමරිය...

ඝන අන්ධකාරයට සඳ එළියක් සේ
මගේ හදවිලට රිංගුවේ නුඹයි
නෙතට නින්දක් නොමැති රැයේ
පහන් වන තුරාවට සක්මන් කළ සඳ කුමරිය

එදා නුඹ ගැන ලියූ නිසදැස්
මෙදා මගේ පොතුලග බොඳවීලා
මගේ සඳ කුමරි යයි කියා මා ගත දැවවීලා
සුමුදු වලාකුලකින් සැඟවීලා ගියාදෝ

සෙනෙහසේ නාමයෙන් මුමුනන්ට බැරිවී පද
ඇඟිලි වෙව්ලුවා පත්හිඳ ගිලිහී ගිය

සෙ/2ඩී03197
ලා/කෝප්‍රල් දයාරත්න ඩීඒටී
2 ශ්‍රීලපාබ

### මව්පිය සෙනෙහස...

අම්මා ඇසට ඇඩුනත්
ලොවේ හිස් වදනින් එලක් නැත
ඔබේ පුතු දිරි සවිය ගෙන මෙලොව
කිරුළු පැළඳ රජෙක් සෙරුමට
කඳුළු පමණක් තුරුළු කරගෙන
මා සැනසුවේ කිමද අම්මේ නුඹ...

සෙ/2120597
ආසෙ පතිරණ අයිච්ච්
7 ශ්‍රීලංසිං

### සසර...

තිමිරියෙය ඇරයුමක් නොවෙනා
සිසිරියෙය නැවතුමක් නොවෙනා
රියසකවන් යනෙන ගමනා
නැත නිමක් මේ සසර සරනා
තන්හා රතී රඟා සමඟා
රඟයි රැඟුමා නිමාවන තුරා
කෙනෙක් යෙනුනාද ගමන සමඟා
ඇත විඩාව පමණ ඉක්මා
නැත නිමක් සසරෙ කිසිදා...

සෙ/2116169
ආසෙ ආරියරත්න එච්ඩබ්ලිව්එල්යූ
7 ශ්‍රීලංසිං

### සැබෑ ආදරය...

මේ ආදරය ලැබුණේ ඔබට
ආදරය කිරීමට පමණයි
මේ දෑස ලැබුණේ මට ඔබව
දැකගන්නට පමණයි
මේ සවන් ලැබුණේ ඔබේ වදන්
අසන්නට පමණයි
ඉතින් මම සුසුමක් වෙන්නම් ඔබේ
හදවත පමණක් සිඹින්න
මම කඳුලක් වෙන්නම් ඔබේ
හදවත පමණක් තෙමන්න
මම හසරැල්ලක් වෙන්නම් ඔබේ
හදවත පමණක් දැකගන්න
මම පෙරුම් පුරන්නම් දිවිතුරු ඔබ
මගෙම කරගන්නට හැමදාම

සෙ/285191
ලා/කෝ වික්‍රමසිංහ ඩබ්ලිව්එම්එම්එස්ඩී
3 ශ්‍රීලංසිං

# අපාය...

**දුව :** අම්මා මම කැමති නැහැ චමින්ද එක්ක විවාහ වෙන්න. එයා කියනව අපාය කියල එකක් තැහැල්ලු...

**අම්මා :** ඒ ගැන කරදර වෙන්න ඕන නැහැ. බැඳල මාසෙන් එයාට තේරුම් යයි එහෙම තැනක් තියනව කියල...




# ඔළුවට බර නැද්ද?...

පුවත්පත් විකුණු ළමයාගේ හිස මත තිබුනේ ඔහුට දරාගත නොහැකි තරමේ විශාල පත්තර මිටියකි. එය දුටු කාරුණික මහියකු ඔහුගෙන් මෙසේ ඇසීය.

"ඔච්චර පත්තර ගොඩක් තියාගෙන ඉන්න කොට ඔළුවට බර නැද්ද පුතා?"

"නෑ මහත්තයෝ... මම මේවා විකුණුවාට කියවන්නේ නැහැ"යි ළමයා පිළිතුරු දුන්නේය.





# අපූරු තේරීම...


ගොවියකු හට මෝටර් රථයක් මිළදී ගැනීමට සිත් විය. ඒ සඳහා මුදල් එක්රැස් කරගත් ඔහු රථයක් මිළදී ගැනීම සඳහා නගරය කරා නික්මුනේ සිය මිතුරකුද සමඟය.

මෝටර් රථය පිරික්සා කර බැලූ ගොවියා අවසානයේදී මිළට ගත්තේ එළදෙනකි.

"තමුසෙගෙ මොළේ හොඳ නැද්ද?" යි මිතුරා ඔහුගෙන් විමසා සිටියේය.

"එළදෙනගේ පිටේ නැගල ගමන් බිමන් යන්න ගියොත් මිනිස්සු මොනව නොකියාවිද?"

"වෙන්න පුළුවන්. ඒත් මම කාර් එකකින් කිරි දොවන්න හැදුවොත් මිනිස්සු මොනව නොකියාවිද?" යි ගොවියා ඇසීය.



# ආගමට ලැදි ටීචර්...



**දුව :** "අපේ පන්තිභාර ටීචර් ආගමට ලැදියි වගෙ අම්මෙ" යි දඟකාර ළමයා කියා සිටියේය...

**අම්මා :** "ඇයි දුවේ එහෙම කියන්නෙ"...

**දුව :** "නෑ අම්මෙ මොනව හරි ප්‍රශ්නයක් අහන හැම තිස්සෙම ටීචර් අපොයි දෙයියනේ" කියල කියනව...

**වෘත්තීය දිවියේ අනේකවිධ කඩඉම් පසු කොට**
**සුබ මොහොතින් නව තනතුරු ලැබූ ඔබ සියලු දෙනාට දිරිය, විරිය, රැකවරණය ලැබේවායි**
**"රණවිරුවා" මෙසේ සුබ පැතුම් එක්කරයි.**



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල්**
**ඩීඑම්ජේඩීබී පුස්සැල්ල**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 මැයි මස 04 වන දින සිට**



යුද්ධ හමුදා මූලස්ථානයේ විධායක ජෙනරාල් ලෙස

**මේජර් ජෙනරාල්**
**ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2022 මැයි මස 05 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල්**
**පීආර්ආර්පී ජයවර්ධන**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ**

**2022 මැයි මස 06 වන දින සිට**



61 වන පාබල සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**එන්ඩීයූ**

**2022 මැයි මස 05 වන දින සිට**



ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති ලෙස

**බ්‍රිගේඩියර්**
**ජේඑස්ඩබ්ලිව්එස් රත්නායක**
**එන්ඩීයූ**

**2022 අප්‍රේල් මස 29 වන දින සිට**



57 වන පාබල සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**ජේපීසී පීරිස්**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ**

**2022 මැයි මස 05 වන දින සිට**



21 වන පාබල සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**එච්ඩීඩබ්ලිව්කේඑන් පරියගම**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 මැයි මස 07 වන දින සිට**



1 වන බලකායේ බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික ලෙස

**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව්එස්ජේ ලියනවඩුගේ**
**ආර්එස්පී**

**2022 මැයි මස 05 වන දින සිට**



යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ලෙස

**බ්‍රිගේඩියර්**
**ආර්පීඒආර්පී රාජපක්ෂ**
**ආර්එස්පී**

**2022 මැයි මස 11 වන දින සිට**



යුද්ධ හමුදා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**ඒඑම්එස් ප්‍රේමවංශ**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

**2022 මැයි මස 05 වන දින සිට**



622 වන පාබල
බලසේනාධිපති ලෙස

**කර්නල්**
**එච්එම්පීර් හේරත්**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2022 අප්‍රේල් මස 30 වන දින සිට**



562 වන පාබල
බලසේනාධිපති ලෙස

**කර්නල්**
**ජේඑම්ජී ජයසේකර**
**ආර්එස්පී යූඑස්පී**

**2022 මැයි මස 05 වන දින සිට**



21 වන පාබල සේනාංකයේ කර්නල්
ප්‍රමා ලෙස

**කර්නල්**
**ආර්ආර්එම්පීඑන්බී බඹරදෙනිය**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**පීඑස්සී**

**2022 මැයි මස 05 වන දින සිට**



59 වන පාබල සේනාංකයේ
කර්නල් ප්‍රමා ලෙස

**කර්නල්**
**එච්ජී හපුගොඩ**
**යූඑස්ජීසීපීඑස්සී**

**2022 මැයි මස 10 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(මුලතිව්)
කර්නල් (පාලන/හකාස) ලෙස

**කර්නල්**
**එච්කේඑල්එස් සිල්වා**

**2022 මැයි මස 17 වන දින සිට**



ඉංජිනේරු සේවා (මධ්‍යම)
වැඩපලෙහි සේනාවිධායක ලෙස

**කර්නල්**
**එම්එස්බී පෙරේරා**
**යූඑස්පී**

**2022 මැයි මස 09 වන දින සිට**



යුද්ධ හමුදා මූලික රෝහල
(මහනුවර) අණදෙන නිලධාරී ලෙස

**කර්නල්**
**එම්පීඑස්ආර් අමරසේකර**
**යූඑස්පී**

**2022 මාර්තු මස 16 වන දින සිට**



4 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ
අණදෙන නිලධාරී ලෙස

**ලුතිනන් කර්නල්**
**ඩබ්ලිව්ඩීඩීආර් වීරපුර**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

**2022 අප්‍රේල් මස 21 වන දින සිට**



11 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ
අණදෙන නිලධාරී ලෙස

**ලුතිනන් කර්නල්**
**ඒඑම්සීයේ ගුණතිලක**

**2022 අප්‍රේල් මස 25 වන දින සිට**



23 වන විජයබාහු පාබල
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**එච්එම්ජේඑස් බංඩාර**
**ආර්එස්පී**



17 වන ඉංජිනේරු සේවා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ටීඩීපී එදිරිසිංහ**
**එල්එස්සී**

**2022 මැයි මස 11 වන දින සිට**



7 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**එස්එස්ජී හාරායනගේ**

**2022 අප්‍රේල් මස 18 වන දින සිට**

# එතෙරදී පෑ දස්කම්



ඉකුත් ජනවාරි 05 වන දින සිට මාර්තු 15 වන දින දක්වා ඉන්දියාවේ පිහිටි පාබල පුහුණු පාසල වෙතින් පවත්වන ලද මෝටාර් අවි පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා පාබල පුහුණු මධ්‍යස්ථානයේ බලඇණි ආධාරක අවි ඛණ්ඩයේ උපදේශක රාජකාරි කරනු ලබන සෙ/416597 බලලත් නිලධාරී II ලක්සිරි ඒ ආර්එස්පී යූඑස්පී සහභාගී විය. එහිදී, ඔහු එම පාඨමාලාවේ විදේශීය සිසුන් අතරින් ප්‍රථම ස්ථානය දිනාගනිමින් යුද්ධ හමුදාවටත්, සමස්ත රටටත් ඉමහත් කීර්තියක් අත්කර දෙන ලදී.


# රණවිරුවා



**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 ඔහි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**ගුප්ත දිගුව**

51445/51446

**'රණවිරුවා' අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
කේපීපී ද සිල්වා ආර්එස්පී පීඑස්සී



**උපදේශකත්වය**

කර්නල්
ඩීඑම්එම් දිසානායක ආර්ඩබ්ලිව්පී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත චමින්ද වද්දිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්ඩබ්ලියු ලක්ෂිකා

# ඒතෙර මෙහෙයට තවත් හමුදා කණ්ඩායමක්







මාලි රාජ්‍යයේ සාමසාධක රාජකාරීන් සඳහා රපෝර්තු කර ඇති III වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමේ වසරක සේවා කාලය අවසන් වීමෙන් පසු එම රාජකාරී භාරගැනීම සඳහා IV වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමට අයත් නිලධාරීන් 20 දෙනකු සහ සෙසුනිලයින් 223 දෙනකු අදියර 3 ක් යටතේ මාලි රාජ්‍යය වෙත රපෝර්තු කරවීමට නියමිතව ඇත.

ඒ අනුව එහි පළමු සහ දෙවන අධියර වශයෙන් නිලධාරීන් 17 ක් සහ සෙසුනිලයින් 183 දෙනකු 2022 මැයි 23 වන දින සහ 25 වන දින මාලි රාජ්‍යය වෙත රපෝර්තු කරවනු ලැබූහ.

එලෙස පිටත්ව ගිය 100 දෙනකුගෙන් යුත් පළමු කණ්ඩායමට සුබපැතීම සඳහා ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් මැයි 23 වන දින කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට පැමිණියේය.

හතරවන අදියර යටතේ ප්‍රථමයෙන් මාලි රාජ්‍ය බලා පිටත්ව යන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමෙහි අණදෙන නිලධාරී කර්නල් චන්දන ජයමහ සහ එම කණ්ඩායමේ සාමාජිකයින් සමග සුහදව අදහස් හුවමාරු කරගත් යුද්ධ හමුදාධිපති ඔවුන් සියලුදෙනාටම එහිදී සුබපැතුම් එක්කළේය. මාලි රාජ්‍යයේ ස්ථාපිත එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් සඳහා නිලධාරීන් 03 ක් සහ සෙසුනිලයින් 40 දෙනකුගෙන් සමන්විත 3 වන අදියර නුදුරේදී එහි රපෝර්තු කරවීමට නියමිතව ඇත.

මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් එක්වූහ.

**"රෙජිමේන්තු 12 කින් සමන්විත යුද්ධ හමුදාවේ සාමාජිකයින් වන ඔබ, එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් රාජකාරීන්හි නිරතවීමේදී ඔබගේ වෘත්තීය හැකියාවන් උපරිමයෙන් ඉටුකළ යුතු බව මතක තබාගත යුතුයි. මාලි රාජ්‍යය සඳහා හමුදාමය වශයෙන් දායකත්වය සපයන රටක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අපේ රටට ලබා දී ඇති පිළිගැනීම තුළින් ද එය පිළිබිඹු වේ. ඔබගේ රාජකාරියට බාධා කිරීමට කිසිවකුට ඉඩ නොතබා දැඩි විනයකින් යුතුව වගකීම් සහගතව රාජකාරී කටයුතුවල නිරත වී අප මාතෘභූමියේ ගෞරවය ආරක්‍ෂා කරගැනීම ඔබ සියලුදෙනාගේ වගකීම සහ යුතුකමයි"**

**- යුද්ධ හමුදාධිපති -**

# අභිමානය රැඳවූ ගෞරවනීය නික්ම යාම...



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ නොමැකෙන මතක සටහන් රැසක් තැබූ හිටපු යුද්ධ හමුදාධිපතිතුමන් එම තනතුරෙන් නික්ම යන ලද්දේ එතෙක් විසිර තිබූ යුද්ධ හමුදා මූලස්ථානයේ ශාඛා, අංශ සියල්ලද පෞඪත්වයෙන් පිරි එක් සෙවණකට ගොනු කරමිනි. "නොහැක්කක් නොමැත" යන ආදර්ශ පාඨය වචනයේ පරිසමාප්තයෙන්ම අරුත් ගැන්වූ එතුමන් යුද්ධ හමුදාවට ගෞරවය හා අභිමානය හැර අන්කිසිවක් අත්කර නොදුන්නේය.

නික්ම යන මොහොතේ මග දෙපස රැස්ව සිටි නිලධාරීන් හා සෙබළුන්ගේ හෘදයාංගම සමුදීම යුද්ධ හමුදාවේ උන්නතිය වෙනුවෙන් එදාමෙදාතුර එතුමන් ඉටුකළ මහඟු මෙහෙයට තුටුපඬුරක් වැන්න. එසේම, ඒ අයුරින් නව යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපතිවරයකුට බුහුමන් පුදකළ ප්‍රථම අවස්ථාවද එය ලෙස ඉතිහාසයට එක්වේ. සමුගත් යුද්ධ හමුදාධිපතිතුමනි, "රණවිරුවා" හි මේ හෘදයාංගම සුබපැතුම්ද පිළිගන්න.



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.